# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,283 - 2022 ජුනි මස 03 වැනි සිකුරාදා - 2022.06.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 908 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 911 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | 914 |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 917 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 921 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2022 ජුනි මස 24 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 ජුනි මස 10 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ලංසු සඳහා ආරාධනයයි

### ශ්‍රී ලංකා දුම්රිය සේවය

ණය අංක : IDA - 63440

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත ලෝක බැංකුව වෙතින් සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා වන CERC ව්‍යාපෘතිය අරභයා ණය මුදලක් ලැබී ඇති අතර, එම ලැබීම්වලින් කොටසක් පහත සඳහන් ප්‍රසම්පාදනය සඳහා වන කොන්ත්‍රාත්තුව යටතේ ගෙවීම් සඳහා යොදා ගැනීමට අදහස් කෙරේ.

2. කොළඹ, ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙනුවෙන් ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් දේශීය නිෂ්පාදකයින්/සැපයුම්කරුවන් වෙතින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

වගුව 1

| *අනු. අංකය* | *ලිපි ගොනු අංකය* | | *විස්තරය* | *ලිපිලේඛන ගාස්තුව* | *ලංසු සුරක්ෂණය* |
|---|---|---|---|---|---|
| 01 | SRS/F.7820 | | ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දුම්රිය ස්ථාන 10ක් ඇතුළුව ස්ථාන 12 ක සනීපාරක්ෂක පහසුකම් උත්ශ්‍රේණිගත කිරීම | | |
| | | අ. | අම්බලන්ගොඩ දුම්රිය ස්ථානය | රු. 2,100.00 | රු. 55,000.00 |
| | | ආ. | නාවලපිටිය දුම්රිය ස්ථානය | රු. 2,000.00 | රු. 52,000.00 |
| | | ඇ. | රාගම දුම්රිය ස්ථානය | රු. 1,000.00 | රු. 47,000.00 |
| | | ඈ. | මාතර දුම්රිය ස්ථානය | රු. 5,200.00 | රු. 1,54,000.00 |
| | | ඉ. | මොරටුව දුම්රිය ස්ථානය | රු. 2,000.00 | රු. 52,000.00 |
| | | ඊ. | කුරුණෑගල දුම්රිය ස්ථානය | රු. 3,600.00 | රු. 1,01,000.00 |
| | | උ. | මීගමුව දුම්රිය ස්ථානය | රු. 3,600.00 | රු. 1,02,000.00 |
| | | ඌ. | හපුතලේ දුම්රිය ස්ථානය | රු. 2,500.00 | රු. 68,000.00 |
| | | ඔ. | ගම්පහ දුම්රිය ස්ථානය | රු. 3,100.00 | රු. 87,000.00 |
| | | ඕ. | කොළඹ කොටුව දුම්රිය ස්ථානය | රු. 2,350.00 | රු. 63,000.00 |
| | | එ. | ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු (CME) උප දෙපාර්තමේන්තුව, රත්මලාන. | රු. 2,700.00 | රු. 74,000.00 |
| | | ඒ. | ප්‍රධාන ඉංජිනේරු (මෝටිව් පවර්) උප දෙපාර්තමේන්තුව, දෙමටගොඩ. | රු. 6,550.00 | රු. 1,96,000.00 |

3. ලංසුකරණය ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය මගින් මෙහෙයවනු ලැබේ.

4. අභිලාෂී යෝග්‍යතා පූර්ණ ලංසුකරුවන්ට **2022.05.24 දින සිට 2022.06.08** දින තෙක් කාර්යාල දිනයන්හි පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා පහත සඳහන් ලිපිනයේදී වැඩිමනත් තොරතුරු ලබා ගැනීමටත් ලංසුකරණ ලිපිලේඛන පරීක්ෂාකර බැලීමටත් පිළිවන.

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන)
දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව,
ඕල්කොට් මාවත,
කොළඹ 10. ශ්‍රී ලංකාව.
දුරකථන අංක : 94(11) 2438078/2436818
ෆැක්ස් අංක : 94(11)2432044
විද්‍යුත් තැපැල: srs.slr@gmail.com
වෙබ් අඩවිය : www.railway.gov.lk

5. වැඩිමනත් තොරතුරු සඳහා, කොළඹ 10, ඩී. ආර්. විජේවර්ධන මාවත, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ මාර්ග හා කර්මාන්ත උප දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු (මාර්ග හා කර්මාන්ත) (Way and Works) අමතන්න.

| *ලිපිගොනු අංකය* | *සුදුසුකම් අවශ්‍යතා* | *පූර්ව ලංසු රැස්වීම පවත්වන දිනය හා ස්ථානය* |
|---|---|---|
| SRS/F.7820 | * කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරු අසාධුලේඛන ගත නොවූවකු විය යුතු අතර, පහත සුදුසුකම් සහිත අයකු විය යුතුය.<br><br>(i) ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ, ගොඩනැගිලි ඉදිකිරීම් - (6 ශ්‍රේණිය සඳහා ලියාපදිංචිය ලබා තිබිය යුතුය).<br><br>(ii) 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 8 වන වගන්තියට අනුකූලව පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් විසින් නිකුත් කළ වලංගු සහතිකයක් ලංසුකරු සතුවිය යුතුය.<br><br>* කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට අවශ්‍ය සුදුසුකම් අවශ්‍යතාවයන්ට පහත දෑ ද ඇතුළත්ය.<br><br>(i) ලංසුකරුගේ පසුගිය 05 වසරක දළ වටිනාකම ධනාත්මක විය යුතුය.<br><br>(ii) පසුගිය වසර 05 තුළ ප්‍රධාන කොන්ත්‍රාත්කරු ලෙස අඩුතරමින් ඉදිකිරීම් ව්‍යාපෘති දෙකක්වත් සම්පූර්ණ කර තිබීම. | 2022.06.02 වැනි දින පෙ.ව. 10.30 ට කොළඹ-10, (මාර්ග හා කර්මාන්ත) උප දෙපාර්තමේන්තුව, ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය. |

06. ශ්‍රී ලංකාව කොළඹ 10, ඕල්කොට් මාවත, දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුවේ, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන) වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා වගුව 1 හි සඳහන් පරිදි ආපසු නොගෙවන ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව **2022.05.24 දින සිට 2022.06.08** දින (ශ්‍රී ලංකා වේලාවෙන්) ප.ව. 3.00 තෙක් ඉංග්‍රීසි බසින් වන ලංසුකරණ ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් අභිලාෂී ලංසුකරුවන්ට ලබාගත හැකිය.

07. සියලුම ලංසු සමග ලංසු සුරක්ෂණයක් එවිය යුතුය. ලංසු සුරක්ෂණය ශ්‍රී ලංකා මහ බැංකුව මගින් අනුමත ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන බැංකුවක් මගින් නිකුත් කළ කොන්දේසි විරහිත ඇපකරයක් විය යුතුය.

08. **ලංසු 2022.06.09 දින ප. ව. 2.00** ට හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ගෙනැවිත් භාරදිය යුතුය. ලංසු භාර ගැනීම අවසන් වූ වහාම ලංසු විවෘත කෙරේ. ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ට ලංසු විවෘත කිරීමේ අවස්ථාවට සහභාගි වන මෙන් ඉල්ලා සිටිනු ලැබේ. ප්‍රමාද වී ලැබෙන ලංසු භාරගනු නොලැබේ ‍:

සභාපති, ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව,
දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව,
ඕල්කොට් මාවත, කොළඹ 10.

සභාපති,
ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව,
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

06-44

**ඉඩම් අමාත්‍යාංශය**

මිනින්දෝරු දෙපාර්තමේන්තුව

**මිල ගණන් කැඳවීම**

***ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල සඳහා ගොඩනැගිලි කුළියට ගැනීම - 2022***

වසර දෙකක කාලයක් සඳහා පහත දැක්වෙන ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය සඳහා ගොඩනැගිලි කුළියට ගැනීමට මිල ගණන් **2022.06.17 වැනි දින පස්වරු 2.00** දක්වා අදාළ පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයේ දී භාරගනු ලැබේ. එදිනම ප. ව. 2.05 ට මිල ගණන් විවෘත කරනු ලැබේ.

| *පළාත* | *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය* | *මිල ගණන් භාර ගන්නා ස්ථානය* | *ආසන්න නගරය* | *නිවස අවශ්‍ය දිනය* |
|---|---|---|---|---|---|
| බස්නාහිර පළාත | කොළඹ | හෝමාගම | පළාත් සර්වේයර් ජනරාල් (බස්නාහිර පළාත), පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය, කොළඹ 05 | හෝමාගම නගරය අවට | 2022.07.01 |
| බස්නාහිර පළාත | කොළඹ | කොළඹ 1 | පළාත් සර්වේයර් ජනරාල් (බස්නාහිර පළාත), පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය, කොළඹ 05 | මහරගම නගරය අවට | 2022.07.01 |
| නැගෙනහිර පළාත | මඩකලපුව | කලවන්චිකුඩි | පළාත් සර්වේයර් ජනරාල් (නැගෙනහිර පළාත),පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය, ත්‍රිකුණාමලය | කලවන්චිකුඩි නගරය අවට | 2022.07.01 |

*සපුරාලිය යුතු පොදු අවශ්‍යතා :*

සෑම ගොඩනැගිල්ලක්ම ආරක්ෂිත වැටකින් හෝ තාප්පයකින් ආරක්ෂා වී තිබිය යුතු ය. ජල නළ පහසුකම් තිබිය යුතු අතර, අපද්‍රව්‍ය හෝ ජලය ඉවත් කිරීමේ ක්‍රමවත් පද්ධතියක් තිබිය යුතු ය. ජල හා විදුලි මීටර් වෙන වෙන ම තිබිය යුතු ය. යාබදව අධික ශබ්ද නැගෙන කර්මාන්ත ශාලා හෝ එවැනි වෙනත් දෑ නොතිබිය යුතු ය. ගොඩනැගිල්ල පිහිටා ඇත්තේ ප්‍රධාන මාර්ගයට යාබදව නොවේ නම් ඒ සඳහා ක්‍රමවත් පිවිසුම් මාර්ගයක් තිබිය යුතු ය. අවම වශයෙන් වාහන තුනක් නවතා තැබීමට පහසුකම් හා ගරාජ පහසුකම් තිබිය යුතු ය. මායිම් ගල් සකස් කිරීම සඳහා ඉඩ පහසුකම් තිබිය යුතු අතර, නිලධාරීන් දහදෙනෙකුට ප්‍රමාණවත් කාමර හෝ ඉඩ පහසුකම් ද තිබිය යුතු ය. ගොඩනැගිල්ලේ වර්ග ප්‍රමාණය අවම වශයෙන් වර්ග අඩි 2300 පමණ හෝ ඊට වැඩි විය යුතුයි.

පහත දක්වා ඇති ආකෘතියට අනුව සකසන ලද ඉල්ලුම් පත්‍රය, *සපුරාලිය යුතු පොදු අවශ්‍යතා* විස්තර ද, සහිතව, ලිපි කවරයේ ඉහළ වම් කෙළවරෙහි " ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල කුලියට ගැනීම (අදාළ ස්ථාන නාමය)" යනුවෙන් සඳහන් කර, 2022.06.17 වැනි දින පස්වරු 2.00 ට පෙර ලැබෙන සේ පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ගෙනැවිත් භාරදීම කළ හැකිය.

ඒ. දිසානායක,
සර්වේයර් ජනරාල්.

2022 මැයි මස 26 වැනි දින,
කොළඹ 05, කිරුල පාර,
සර්වේයර් ජනරාල් කාර්යාලයේ දී ය.

*ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල සඳහා ගොඩනැගිලි කුලියට ගැනීම - 2022*

**මිල ගණන් කැඳවීමේ ඉල්ලුම්පත්‍රය - 2022**

*ගොඩනැගිලි අයිතිකරුගේ -*

1. සම්පූර්ණ නම : ____________.
2. ලිපිනය : ____________.
3. දුරකථන අංකය : ____________.
4. ජාතික හැඳුනුම්පත් අංකය : ____________.

*ගොඩනැගිල්ල -*

1. කුලියට දෙනු ලබන්නේ කුමන ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය සඳහා ද? : ____________.
2. මාසික කුලී මුදල : ____________.
3. පිහිටි ස්ථානයේ ලිපිනය : ____________.
4. අදාළ නගරයේ සිට පිහිටි ස්ථානයට ඇති දුර ප්‍රමාණය කි. මී. : ____________.
5. භූමියේ විශාලත්වය : ____________.
6. ගොඩනැගිල්ලේ වර්ග අඩි ප්‍රමාණය හා කාමර ගණන ආදිය පිළිබඳව විස්තර: ____________.
7. වෙනම කියවිය හැකි ජල මීටර් තිබේ ද? : ____________.
8. වෙනම කියවිය හැකි විදුලි මීටර් තිබේ ද? : ____________.
9. ආරක්ෂිත මායිම් විස්තර සපයන්න (තාප්පය/කම්බි වැට/...........................) : ____________.
10. නවතා තැබීමට හැකි වාහන ගණන : ____________.

ඉහත තොරතුරු සත්‍ය බවත් යම් තොරතුරක් අසත්‍ය බව හෙළිවුවහොත් ම විසින් ඉදිරිපත් කරනු ලබන මිල ගණන් සර්වේයර් ජනරාල් ප්‍රතික්ෂේප කරනු ලබන බව මම දන්නා බවත් මෙයින් පිළිගනිමි.

____________.
අයදුම්කරුගේ අත්සන.

06-90

# බඩු බාහිරාදිය විකිණීම්

**දිසා මහෙස්ත්‍රාත් අධිකරණය - වව්නියාව**

අධිකරණය මගින් රාජසන්තක කරන ලද වැලි බොරළු සහ පස් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම - 2022

වවුනියාව මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු ගණනකට අයත් රාජසන්තක කරන ලද පස් වර්ග වලින් කොටසක් (වැලි කියුබ් 21.76, බොරළු කියුබ් 107, පස් කියුබ් 08.25, **2022.06.08 වැනි දින වවුනියාව ඇතුල් වට රවුම් පාරේදී පෙ. ව. 9.30** ට ප්‍රසිද්ධ වෙන්දේසි කිරීමට ඇත.

01. රෙජිස්ට්‍රාර් වරයාගේ අනුමැතිය ලබා ප්‍රසිද්ධ වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට ප්‍රථමයෙන් වැලි, පස් සහ බොරළු වර්ග නිරීක්ෂණය කළ හැකි ය.

02. වැලි බොරළු සහ පස්වලට වවුනියාව මහාධිකරණයේ මිල නිර්ණය කිරීමේ කණ්ඩායම විසින් නිර්ණය කරන ලද අවම මිල නොලැබෙන විට නැවත ලබා ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

03. වෙන්දේසියෙන් මිලදී ගන්නා වැලි, පස් සහ බොරළු සඳහා වූ මුදල් ඒ අවස්ථාවේ දී ම ගෙවිය යුතු ය.

04. වැලි පස් හා බොරළු මිලදී ගැනීම සඳහා පැමිණෙන අය ජාතික හැඳුනුම්පත රැගෙන පැමිණිය යුතු ය.

05. මිලදී ගන්නා ලද වැලි, පස් සහ බොරළු 2022.06.10 වැනි දින ප. ව. 3.00 පෙර එම ස්ථානයෙන් ඉවත් කර ගත යුතු ය.

06. වැලි, පස් සහ බොරළු මිලදී ගත් පුද්ගලයන් භූ විද්‍යා හා පතල් කැනීම් දෙපාර්තමේන්තුවෙන් ප්‍රවාහනය සඳහා අනුමැතිය ලබා ගත යුතු ය.

අතිරේක මහෙස්ත්‍රාත්,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,
වවුනියාව.

2022 මැයි මස 18 වැනි දින.

06-84

**දෙහිඅත්තකණ්ඩිය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය**

**හිමිකම් නොපාන ලද වාහන වෙන්දේසිය**

දෙහිඅත්තකණ්ඩිය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ පැවති නඩු වලට අදළව නඩු භාණ්ඩ වශයෙන් ඉදිරිපත් කර තිබූ, මෙතෙක් හිමිකම්පාන්නෙකු ඉදිරිපත් නොවූ වාහන රාජසන්තක කර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා පියවර ගැනීමට සිදු වී ඇත.

එබැවින් පහත විස්තර සඳහන් රථවාහන සම්බන්ධයෙන් හිමිකම් පාන්නෙකු සිටීනම් මෙම නිවේදන පළ වූ දින සිට මාස 02ක් ඇතුලත හිමිකම් පෑමට අදළ ලේඛන සමග දෙහිඅත්තකණ්ඩිය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් වී දැනුම් දෙන ලෙස මෙයින් දන්වා සිටිමි.

| අනු. අංකය | නඩු අංකය | වාහන විස්තරය |
|---|---|---|
| 01. | 22568 | අංක රහිත අත් ට්‍රැක්ටරය |
| 02. | 22568 | UP BDX 9277 යතුරු පැදිය |
| 03. | 22568 | SP BEW 3898 යතුරු පැදිය |
| 04. | 26270 | NC VK 7340 යතුරු පැදිය |
| 05. | 22565 | NW JR 9881 යතුරුපැදිය. |

ඩබ්. එම්. අයි. වාසල,
දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්,
දෙහිඅත්තකණ්ඩිය.

06-50

---

**දෙහිඅත්තකණ්ඩිය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය**

**දෙහිඅත්තකණ්ඩිය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය මගින් රාජසන්තක කරන ලද දිරාපත් වූ දූව ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

දෙහිඅත්තකණ්ඩිය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු වලට අදළව රාජසන්තක කරනු ලැබූ දිරාපත් වූ දූව 2022.06.21 වැනි දින **පෙ. ව. 9.00** සිට දෙහිඅත්තකණ්ඩිය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

1. අධිකරණ රෙජිස්ට්‍රාර්වරියගේ අවසර මත වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2කට මත්තෙන් භාණ්ඩ පරීක්ෂා කර බැලීමට මහජනයාට ඉඩ දෙනු ලැබේ.

2. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගැනෙන අවස්ථාවේදී අධිකරණයේ අභිමතය පරිදි, එම නඩු භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

3. වෙන්දේසියේ දූව මිලදී ගන්නා ගැණුම්කරුවන් තම අනන්‍යතාවය සනාථ කිරීමට ජාතික හැඳුනුම්පත රැගෙන ඒම අනිවාර්ය වේ.

4. භාණ්ඩ මිලදී ගැනීම ලංකාවේ වලංගු මුදලින් කළ යුතු අතර, ඒ සඳහා අධිකරණය මගින් රිසිට්පතක් නිකුත් කරනු ලැබේ.

5. මිලදී ගන්නා ලද භාණ්ඩ වෙන්දේසි දින ප. ව. 4.00 ට පෙර වෙන්දේසි භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

| LOT අංකය | විස්තරය | ප්‍රමාණය | |
|---|---|---|---|
| | | කඳන් | ඉරූ දූව |
| 01. | දිරාපත් ව ඇත | සම්පූර්ණයෙන් දිරාපත් වී ඇත. | |
| 02. | දිරාපත් ව ඇත | - | 05 |
| 03. | දිරාපත් ව ඇත | 10 | - |
| 04. | දිරාපත් ව ඇත | 07 | - |
| 05. | දිරාපත් ව ඇත | 02 | - |
| 06. | දිරාපත් ව ඇත | 01 | 10 |
| 07. | දිරාපත් ව ඇත | - | 03 |
| 08. | දිරාපත් ව ඇත | 08 | 15 |
| 09. | දිරාපත් ව ඇත | - | 15 |
| 10. | දිරාපත් ව ඇත | 11 | 12 |
| 11. | දිරාපත් ව ඇත | 25 | 02 |
| 12. | දිරාපත් ව ඇත | - | 15 |
| 13. | දිරාපත් ව ඇත | 06 | 02 |
| 14. | දිරාපත් ව ඇත | - | 15 |
| 15. | දිරාපත් ව ඇත | 14 | 12 |
| 16. | දිරාපත් ව ඇත | 15 | - |
| 17. | දිරාපත් ව ඇත | 05 | - |
| 18. | දිරාපත් ව ඇත | 13 | 13 |
| 19. | දිරාපත් ව ඇත | - | 142 (දළ වශයෙන්) |
| 20. | දිරාපත් ව ඇත | 525 (දළ වශයෙන් | - |
| 21. | දිරාපත් ව ඇත | 80 (දළ වශයෙන්) | - |
| 22. | දිරාපත් ව ඇත | 01 | - |
| 23. | දිරාපත් ව ඇත | 06 | 02 |
| 24. | දිරාපත් ව ඇත | 04 | - |
| 25. | දිරාපත් ව ඇත | 10 | - |

ඩබ්. එච්. එම්. අයි. වාසල,
දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්.

2022 මැයි මස 25 වැනි දින,
දෙහිඅත්තකණ්ඩිය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

06-51

**මහෙස්ත්‍රාත් අධිකරණය - කල්මුණේ**

රාජසන්තක කරන ලද නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කල්මුණේ මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදළ රාජසන්තක කරන ලද පහත සඳහන් නඩු භාණ්ඩ **2022.06.25 වැනි දින පෙ. ව. 9.00 ට** මෙම අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

1. භාණ්ඩ සම්බන්ධයෙන් යමකට හිමිකම් පාන්නෙකු වේ නම් වෙන්දේසියට එකී භාණ්ඩ ඉදිරිපත් කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කර තහවුරු කළ යුතු ය.

2. වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට කලින් වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය පරිදි මහජනයාට පරීක්ෂා කර බැලිය හැකි වේ.

3. අධිකරණය විසින් නියම කරනු ලබන ලංසුව නොපිළිගැනෙන අවස්ථාවේ දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අයිතිය අධිකරණය සතු වේ.

4. වෙන්දේසියෙන් මිලදී ගන්නා භාණ්ඩ ඒ අවස්ථාවේදී මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු අතර සියලුම ගෙවීම් මුදල් වලින් පමණක් කළ යුතු ය.

5. වෙන්දේසියෙන් භාණ්ඩ මිලදී ගැනීමට පැමිණෙන්නන් තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කර අනන්‍යතාවය තහවුරු කළ යුතු ය.

එම්. එස්. එම්. සම්සුදීන්,
මහෙස්ත්‍රාත්.

2022 මැයි මස 23 වැනි දින,
මහෙස්ත්‍රාත් අධිකරණය,
කල්මුණේ.

**කල්මුණේ මහෙස්ත්‍රාත් අධිකරණයේ 2022.06.25 වැනි දින ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට තිබෙන භාණ්ඩ විස්තරය**

| # | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ගණන |
|---|---|---|---|
| 1. | AR/781/21 | පාපැදිය | 1 |
| 2. | AR/781/21 | පාපැදිය | 1 |
| 3. | AR/781/21 | පාපැදිය | 1 |
| 4. | AR/781/21 | පාපැදිය | 1 |
| 5. | AR/781/21 | පාපැදිය | 1 |
| 6. | AR/854/21 | පාපැදිය | 1 |
| 7. | 29350/PC/03 | පාපැදිය | 1 |
| 8. | නඩු අංක නැත | පාපැදිය | 1 |
| 9. | නඩු අංක නැත | පාපැදිය | 1 |
| 10. | 97989/E/21 | ඇලුමිනියම් වළඳ | 1 |
| 11. | 97724/PC/21 | කැම්රි වර්ගයේ තරාදිය | 1 |
| 12. | 98314/PE/21 | ප්ලාස්ටික් බූලිය | 1 |
| 13. | 98213/PE/21 | ප්ලාස්ටික් බූලිය | 1 |
| 14. | 98314/PE/21 | ඇලුමිනියම් වළඳ | 1 |
| 15. | 97579/CAA/21 | එල්. ඊ. ඩී. විදුලි පන්දම | 1 |
| 16. | 97534/CAA/21 | එල්. ඊ. ඩී. විදුලි පන්දම | 1 |
| 17. | 97535/CAA/21 | එල්. ඊ. ඩී. බල්බය | 1 |
| 18. | 97532/CAA/21 | මල්ටි ප්ලග් | 1 |
| 19. | 97530/CAA/21 | බල්බය | 1 |
| 20. | 97578/CAA/21 | පොප්ලින් රෙදි කැබැල්ලක් | 1 |
| 21. | 97577/CAA/21 | මල්ටි ප්ලග් | 1 |
| 22. | 96937/CAA/20 | මල්ටි ප්ලග් | 1 |
| 23. | 96938/CAA/20 | වතුර කරාම | 1 |
| 24. | 97433/CAA/21 | ඩෙන්සො ස්පාර්ක් ප්ලග් | 1 |
| 25. | 96941/CAA/20 | රෙදි කැබැල්ලක් | 1 |
| 26. | 97437/CAA/21 | ස්මාර්ට් වොච් | 1 |
| 27. | 97080/CAA/21 | එල්. ඊ. ඩී. බල්බය | 1 |
| 28. | 97454/CAA/21 | පාවහන් පොලිෂ් | 1 |
| 29. | 97463/PC/21 | ඩිජිටල් තරාදිය | 1 |
| 30. | 98436/PE/21 | ඇලුමිනියම් වළඳ | 1 |
| 31. | 98441/PC/21 | සවල් | 1 |
| 32. | 98332/PC/21 | කැම්රි වර්ගයේ තරාදිය | 1 |
| 33. | 97434/CAA/21 | වී ඇසුරුම් මලු | 10 |
| 34. | 98720/CAA/22 | ඔටෝ ලාම්පු බල්බ | 1 |
| 35. | 98724/CAA/22 | යුනිවසල් ටීවී රිමෝර්ට් | 1 |
| 36. | 98449/CAA/21 | එල්. ඊ. ඩී. බල්බය | 1 |
| 37. | 98776/CAA/22 | එල්. ඊ. ඩී. විදුලි පන්දම | 1 |
| 38. | 98451/CAA/21 | ටෙක්නො පවර් දුරකථන අරෝපක | 1 |
| 39. | 98452/CAA/21 | වතුර කරාම | 1 |
| 40. | 98778/CAA/22 | ටෙක්නො පවර් දුරකථන ආරෝපක | 1 |
| 41. | 98362/PHI/21 | පත්තර | 1.5 kilo |
| 42. | 97723/PC/21 | කැම්රි වර්ගයේ තරාදිය | 1 |
| 43. | 97110/PHI/21 | ප්ලාස්ටික් බාල්දිය | 1 |
| 44. | 97110/PHI/21 | ප්ලාස්ටික් බාල්දිය | 1 |
| 45. | 97110/PHI/21 | ප්ලාස්ටික් බාල්දිය | 1 |
| 46. | 97110/PHI/21 | ප්ලාස්ටික් බේසම | 1 |
| 47. | 97110/PHI/21 | ප්ලාස්ටික් බේසම | 1 |

| # | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ගණන | # | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ගණන |
|---|---|---|---|---|---|---|---|
| 48. | 97435/CAA/21 | හිස්වැසුම් | 1 | 57. | 96875/PC/20 | බාල්දිය | 1 |
| 49. | 97435/CAA/21 | හිස්වැසුම් | 1 | 58. | 96875/PC/20 | බාල්දිය | 1 |
| 50. | 97974/CAA/21 | හිස්වැසුම් | 1 | 59. | 96875/PC/20 | බාල්දිය | 1 |
| 51. | 97974/CAA/21 | හිස්වැසුම් | 1 | 60. | 96875/PC/20 | සවල් | 1 |
| 52. | 97975/CAA/21 | හිස්වැසුම් | 1 | 61. | 96875/PC/20 | සවල් | 1 |
| 53. | 97976/CAA/21 | හිස්වැසුම් | 1 | 62. | 96875/PC/20 | සවල් | 1 |
| 54. | 97977/CAA/21 | හිස්වැසුම් | 1 | 63. | 98314/PE/21 | ප්ලාස්ටික් බූලිය | 1 |
| 55. | 97978/CAA/21 | යූරියා පොහොර අඩංගු මලු | 1 | 64. | 97989/E/21 | ඇලුමිනියම් තාච්චි | 1 |
| 56. | 96875/PC/20 | බාල්දිය | 1 | | | | |

06-71

---

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

**ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ත්‍රිකුණාමලය නගර හා කඩවත්**

**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ රා රේන්ද විකිණීම**

2022 ජූලි මස 01 දින සිට 2023 ජුනි මස 30 දින දක්වා

2022 ජූලි මස 01 දින සිට 2023 ජුනි මස 30 වැනි දින දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982.08.20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ වී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ප්‍රසම්පාදන භාරගනු ලැබේ.

02. සෑම ප්‍රසම්පාදන පත්‍රයක්ම ත්‍රිකුණාමලය නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකි නියමිත ආකෘති පත්‍රයක පිරවිය යුතු අතර, පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ප්‍රසම්පාදන තැන්පත් මුදලක් තැන්පත් කළ බවට ලබාගත් කුවිතාන්සියක් හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මිල ප්‍රමාණයෙන් යටත් පිරිසෙන් 15% ක වටිනාකමින් යුත් වත්කම් සහතිකයක් ද ඇමිණිය යුතු ය.

03. විධිමත් ලෙස සකස් කරනු ලැබූ සෑම ප්‍රසම්පාදනයක් ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි වම් කෙළවරේ ''අංක ............ දරන ........................ රා තැබෑරුම සඳහා ප්‍රසම්පාදන පත්‍රය'' යනුවෙන් උපලේඛනයේ සඳහන් පරිදි තැබෑරුමේ නම හා අංකය සඳහන් කොට **2022.06.17 වැනි දින ප. ව. 10.00** ට පෙර ත්‍රිකුණාමලය නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම්ට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නැතහොත් එම වේලාවට පෙර ත්‍රිකුණාමලය නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රසම්පාදන පෙට්ටියේ බහාලිය යුතු ය.

04. ප්‍රසම්පාදන ඉදිරිපත් කිරීම 1982.08.20 දින පළ වී ඇති අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට අදාළ විය යුතු ය.

05. 2022.06.17 වැනි දින පෙ. ව. 10.00 ට ප්‍රසම්පාදන පත්‍ර භාරගැනීම අවසන් කළ වහාම ප්‍රසම්පාදන පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ දී සියලුම ප්‍රසම්පාදනකරුවන් ත්‍රිකුණාමලය නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

06. ඉදිරිපත් කරන ලද ටෙන්ඩර්පත් අතුරින් තෝරා ගනු ලබන සාර්ථකම ගැනුම්කරු විසින් මාස 02කට වැඩි තැන්පතු මුදල සහ එක් මසක බලපත්‍ර ගාස්තුව එදිනම ගෙවිය යුතුය.

07. උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් අතුරින් එකක් හෝ කිහිපයක් **2022.06.17** වැනි දින විකිණීමට නොහැකි වුවහොත් නැවත විකිණීම සඳහා **2022 ජුනි මස 20 වැනි දින පෙ. ව. 10.00** දක්වා ප්‍රසම්පාදනපත් භාර ගන්නා අතර, ප්‍රසම්පාදන පත් භාර ගැනීම අවසන් කළ වහාම ප්‍රසම්පාදන පත්‍ර විවෘත කරනු ලැබේ. මේ සඳහා ද ඉහතින් සඳහන් සියලු කොන්දේසි අදාළ වන බව ද සැලකිය යුතු ය.

08. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර ත්‍රිකුණාමලය නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

පී. ධනේෂ්වරන්,
ප්‍රාදේශීය ලේකම්.

2022 මැයි මස 26 වැනි දින,
ත්‍රිකුණාමලය නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *අනු. අංකය* | *කොට්ඨාසය* | *ප්‍රාදේශීය පළාත* | *විවෘත කරන වේලාව* | *වසන වේලාව* | *ආපසු ගෙවනු ලබන ප්‍රසම්පාදන තැන්පතු මුදල රු.* | *ආපසු නොගෙවනු ලබන ප්‍රසම්පාදන තැන්පතු මුදල රු.* |
|---|---|---|---|---|---|---|
| 01. | අංක 01 | විල්ලුන්ඩි අංක 01 | පෙ. ව. 11.00<br>ප. ව. 5.00 | ප. ව. 2.00<br>ප. ව. 8.00 | 3,000 | 1,000 |
| 02. | තේක්කලුන්තු | තේක්කලන්තු අංක 03 | පෙ. ව. 11.00<br>ප. ව. 5.00 | ප. ව. 2.00<br>ප. ව. 8.00 | 1,500 | 1,000 |

06-55

---

## කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

2022-2023 වර්ෂය සඳහා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා රේන්ද විකිණීම

2022 ජූලි මස 01 වැනි දින සිට 2023 ජුනි මස 30 දින දක්වා

2022 ජූලි මස 01 දින සිට 2023 ජුනි මස 30 වැනි දින දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982.08.20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ වී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ප්‍රසම්පාදන භාරගනු ලැබේ.

02. සෑම ප්‍රසම්පාදන පත්‍රයකම කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකි නියමිත ආකෘති පත්‍රය පිරවිය යුතු අතර, පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ප්‍රසම්පාදන තැන්පත් මුදලින්, තැන්පත් කළ බවට ලබාගත් කුවිතාන්සියක් හා අදළ *ටෙන්ඩරයේ සඳහන් මිල ප්‍රමාණයෙන් යටත් පිරිසෙන් 15% ක වටිනාකමින් යුත් වත්කම් සහතිකයක් ද ඇමිණිය යුතු ය.*

03. විධිමත් ලෙස සකස් කරනු ලැබූ සෑම ප්‍රසම්පාදනයක් ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි වම් කෙළවරේ අංක ............ දරන ........................ රා තැබෑරුම සඳහා ප්‍රසම්පාදන පත්‍රය යනුවෙන් උප ලේඛනයේ සඳහන් පරිදි තැබෑරුමේ නම හා අංකය සඳහන් කොට 2022.06.17 වැනි දින ප. ව. 01.00 ට පෙර කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නැතහොත් එම වේලාවට පෙර කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රසම්පාදන පෙට්ටියේ බහාලිය යුතු ය.

04. ප්‍රසම්පාදන ඉදිරිපත් කිරීම 1982.08.20 දින පළ වී ඇති අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට ඇතුළත් විය යුතු ය.

05. 2022.06.17 වැනි දින ප. ව. 01.00 ට ප්‍රසම්පාදනපත්‍ර භාරගැනීම අවසන් කළ වහාම ප්‍රසම්පාදන පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ දී සියලුම ප්‍රසම්පාදනකරුවන් කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

06. ඉදිරිපත් කරන ලද ටෙන්ඩර්පත් අතුරින් තෝරා ගනු ලබන සාර්ථකම ගැනුම්කරු විසින් මාස 02කට වැඩි තැන්පතු මුදල සහ එක් මසක බලපත්‍ර ගාස්තුව එදිනම ගෙවිය යුතුය.

07. උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් අතුරින් එකක් හෝ කිහිපයක් 2022.06.17 වැනි දින විකිණීමට නොහැකි වුවහොත් නැවත විකිණීම සඳහා 2022 ජූනි මස 20 වැනි දින ප. ව. 01.00 දක්වා ප්‍රසම්පාදනපත් භාර ගන්නා අතර, ප්‍රසම්පාදන පත් භාර ගැනීම අවසන් කළ වහාම ප්‍රසම්පාදන පත්‍ර විවෘත කරනු ලැබේ. මේ සඳහා ද ඉහතින් සඳහන් සියලු කොන්දේසි අදාළ වන බව ද සැලකිය යුතු ය.

08. මහජනතාවගේ හා ශිෂ්‍යයන්ගේ යහපත උදෙසා දැනට පවත්වන ස්ථානයෙන් වෙනත් ස්ථානයකට මාරු කළ හැකිය.

09. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

කුමාරසිංගම් ගුණනාදන්,
ප්‍රාදේශීය ලේකම්.

2022 මැයි මස 26 වැනි දින,
කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

| *අනු. අංකය* | *කොට්ඨාසය* | *ප්‍රාදේශීය පළාත* | *විවෘත කරන වේලාව* | *වසන වේලාව* | *ආපසු ගෙවනු ලබන ප්‍රසම්පාදන තැන්පතු මුදල රු.* | *ආපසු නොගෙවනු ලබන ප්‍රසම්පාදන තැන්පතු මුදල රු.* |
|---|---|---|---|---|---|---|
| 03. | කුච්චවේලි | නිලාවේලි අංක 04 | පෙ. ව. 11.00<br>ප. ව. 5.00 | ප. ව. 2.00<br>ප. ව. 8.00 | 3,000 | 1,000 |

06-95

# රජයේ නොවන දැන්වීම්

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීමයි

හෝමාගම, මහකටුවාන පාර, අංක 24/2 හි පදිංචි හේරත් මුදියන්සේගේ කාන්තිමාලා (ජා. හැ. අ. 776702684 V) වන මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් එකී ජනතාවටත් මින් දැනුම් දෙන වග නම්,

කොළඹගෙආර, උඩවලව හන්දිය, ගඟ පාර, අංක 04 පදිංචි හේරත් මුදියන්සේලාගේ සාන්ත කුමාර ගුණවර්ධන (ජා. හැ. අංක 198127804064 හිමි) යන අය ඇටර්නි බලකරු වශයෙන් පත්කරමින් ප්‍රසිද්ධ නොතාරිස් ඩී. එම්. ආර්. සී. දිසානායක විසින් ලියා සහතික කරන ලද අංක 11876 හා 2019 ජූලි 22 වැනි දිනැති ඇටර්නි බලපත්‍ර පොතේ 24 වන කාණ්ඩයේ 187 වන පත් ඉරුවේ දිනපොත් අංක 1037 යටතේ හා 2019.07.25 වැනි දතම යටතේ ලියාපදිංචි කර ඇති ඇටර්නි බලපත්‍රය මින් අවලංගු කරන බවත්, මින් ඉදිරියට එහි බලපැවැත්මක් නොමැති බවත් ය.

මෙම අවලංගු කිරීමෙන් අනතුරුව ඉහත කී හේරත් මුදියන්සේලාගේ සාන්ත කුමාර ගුණවර්ධන විසින් ඉහත කී ඇටර්නි බලපත්‍රය මත කරනු ලබන කිසිදු ක්‍රියාවක් වෙනුවෙන් මා වගකීමට යටත් නොවන බව ද දැනුම් දෙනු ලැබේ.

හේරත් මුදියන්සේගේ කාන්තිමාලා.

අංක 24/2, මහකටුවාන පාර,
හෝමාගම.
ජා. හැ. අංක 776702684 V

06-88

---

## ඇටර්නි බලය අවලංගු කිරීමයි

එක්සත් අරාබි එමීර් රාජධානිය, අබුඩාබි, තැපැල් පෙට්ටි අංක 43088 සීමාසහිත ෆියුග්‍රෝ සර්වි (මිඩ්ල් ඊස්ට්) සමාගමේ රැකියාවක නිරතව සිට වර්තමානයේ පිළියන්දල, මාවිත්තර, අංක 26/3 හි පදිංචි මාපිටියගේ දෙන් ප්‍රියන්ත පුෂ්ප කුමාර (ජා. හැ. අංක 680201951 V) සහ ශ්‍රී ලංකා ගමන් බලපත්‍ර අංක එම් 4667800 වන මා ඇටර්නි අධිපති වශයෙන් පිළියන්දල, මාවිත්තර අංක 26/3 හි පදිංචි ජුවන් ආචාරිගේ මානෙල් කාන්ති (ජා. හැ. අංක 635462752 V) ඇටර්නි බලකරු වශයෙන් නම්කොට පත්කරන ලද ප්‍රසිද්ධ නොතාරිස් එච්. ටී. ජී. කේ. බණ්ඩාර විසින් සහතික කරන ලද අංක 598 සහ වර්ෂ 2015.09.03 දිනැති ශ්‍රී ලංකාවේ රෙජිස්ට්‍රාර් ජෙනරාල් කාර්යාලයේ වර්ෂ 2015.09.08 දින ලිඛිත බලධාරිකම් හා ඇටර්නි බලපත්‍ර ලේඛනයේ 167 කාණ්ඩයේ 42 පත්ඉරුවේ 5060 දිනපොත් අංකය යටතේ ලියාපදිංචි විශේෂ ඇටර්නි බලකරය ඉහත කී ඇටර්නි අධිපති වන මා මෙමගින් අවලංගු කරන අතර, එකී ලේඛනය මෙවක් පටන් බලපැවැත්වීමක් නොමැති බවට ද ලෝකයාට මෙමගින් හෙළිදරව් කර සිටිමි.

මාපිටියගේ දෙන් ප්‍රියන්ත පුෂ්ප කුමාර.

2022 ක්වූ මැයි මස 24 වැනි දින දී ය.

06-89

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීමයි

බස්නාහිර පළාතේ, කඳාන, හල්පේ මාවත, අංක 21/8 හි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 666592921 V හිමි ජයන්ති වෛත්‍යලිංගම් වන මම කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් බී. එස්. උපුල ප්‍රනාන්දු මහතා විසින් ලියා සහතික කළ අංක 2726 හා වර්ෂ 2018 ක් වූ ජූලි 11 වැනි දින දරන ඇටර්නි බලපත්‍රය මගින් බස්නාහිර පළාතේ, දෙහිවල, කළුබෝවිල, ඇන්ඩර්සන් පාර, ඉසිපතන මාවත, අංක 43/3ඒ හි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 543021369 X හිමි මාරියා ඇන්ටනි සෙල්වරාජ් ප්‍රනාන්දු යන අය වෙත පවරන ල ද ඇටර්නි බලපත්‍රය වර්ෂ 2022 ක් වූ මැයි මස 12 වැනි දින පටන් මෙයින් අවලංගු කර ප්‍රත්‍යාදිෂ්ඨ කළ බවට ශ්‍රී ලංකා ජනරජයටත් ශ්‍රී ලංකා වාසීන් සියලු දෙනාටත් මෙයින් දැනුම් දෙමි. තවද, මෙම ඇටර්නි බලපත්‍රය මත අද දිනෙන් පසු කරනු ලබන සියලුම ක්‍රියා සම්බන්ධයෙන් මා වග නොකියන බවට මෙයින් දැනුම් දෙමි.

ජයන්ති වෛත්‍යලිංගම්.

2022 ක් වූ මැයි මස 12 වැනි දින දී ය.

06-93

### නාමය වෙනස් කිරීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 8 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගමේ නාමය වෙනස් කොට ඇති බව එම පනතේ 9 (2) වගන්තිය ප්‍රකාරව දනුම් දෙනු ලැබේ.

සමාගමේ පැවති නාමය : ට්‍රිපල් සේෆ්ටි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පීවී 72804
ලියාපදිංචි කාර්යාල ලිපිනය : අංක 162 - 3/1, නාවල පාර, නුගේගොඩ.
සමාගමේ නව නාමය : ට්‍රිපල් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

සීඒඑස් කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

06-10

---

### ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

කොච්චිකඩේ, දළුවකොටුව, තක්කියා පාර අංක 484/1 හි පදිංචි වික්‍රම ආරච්චිගේ හෙලන් සුසිලා බ්‍රියට්‍රිස් ප්‍රනාන්දු (ජා. හැ. අංක 647170738 V) වන මා විසින් කොච්චිකඩේ දළුවකොටුව, තක්කියා පාර අංක 484/1 හි පදිංචි වික්‍රම ආරච්චිගේ රුසිත් නුවන්ත ප්‍රනාන්දු (ජා. හැ. අංක 199609402345) යන අය වෙත ප්‍රදනය කරන ලද විදේශීය ශ්‍රී ලංකා ඉතාලි තානාපති කාර්යාලයේදී මිලානෝහිදී වර්ෂ 2018 ක් වූ ජූලි මස 09 වන දින ලියා සහතික කරන ලද ගම්පහ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේ දිනපොත් අංක 2940 යටතේ ලියාපදිංචි කර ඇති ඇටර්නි බලපත්‍රය මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කොට අහෝසි කොට අවලංගු කරන ලද බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ආණ්ඩුවට සහ මහජනතාව වෙත මෙයින් දනුම් දෙනු ලැබේ.

ඩබ්. ඒ. එච්. එස්. බියට්‍රිස් ප්‍රනාන්දු.

2022 අප්‍රේල් මස 27 වැනි දින දී ය.

06-11

---

### විශේෂ ඇටර්නි බලය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කොළඹ දිස්ත්‍රික්කයේ, ලේක් ටෙරස්, 14 වන පටුමග, අංක 723/7ඒ යන ලිපිනයේ පදිංචි ශාන්ති අමරංගනී පොඩිමහත්මයා වන මම විසින් මාගේ නීත්‍යානුකූල ඇටර්නි බලකරු ලෙස නුවරඑළිය, හාවාඑළිය, මහින්ද මාවත, අංක 36 යන ලිපිනයේ පදිංචි දිසානායක මුදියන්සේලාගේ නිශ්ශංක පත්කරමින් ලියන ලද ප්‍රසිද්ධ නොතාරිස් එච්. පී. බී. නානායක්කාර මහතා විසින් ලියා සහතික කරන ලද අංක 6994 සහ 2019.03.18 දින දරන විශේෂ ඇටර්නි බලපත්‍රය අද පටන් අවලංගු කොට ප්‍රත්‍යාදිෂ්ඨ කරන බව ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දනුම් දෙමි.

ශාන්ති අමරංගනී පොඩිමහත්මයා.
ඇටර්නි අධිපති.

2022 මැයි මස 13 වැනි දින.

06-12

---

### ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, රාජගිරිය, වැලිකඩ, කෝට්ටේ පාර, අංක 1150 හි පදිංචි මානන්ගොඩ ගමගේ තමරා පියසීලි වන මා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුවටත්, පොදු මහජනතාවටත් මෙයින් දනුම් දෙන වගනම් මා විසින් ශ්‍රී ලංකාව, රාජගිරිය, වැලිකඩ, කෝට්ටේ පාර, අංක 1150 හි පදිංචි තුයිය හැන්දිගේ දීප්ති කුමාර ද සිල්වා වෙත පවරන ලද රෝමයේ, ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ, කොන්සියුලර් එම්. ජෝන් ඒ. ප්‍රනාන්දු මහතා විසින් සහතික කරන ලද 2006 නොවැම්බර් මස 02 වැනි දින දරන ඇටර්නි බලපත්‍රය මගින් මා වෙනුවෙන් ක්‍රියාකිරීමට මාගේ ඇටර්නි බලකරු වශයෙන් පත්කරමින් එම තුයිය හැන්දිගේ දීප්ති කුමාර ද සිල්වා වෙත පවරන ලද ඇටර්නි බලය මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කොට අහෝසි කොට අවලංගු කරන ලද බවත්, එසේ හෙයින් එකී ඇටර්නි බලය මත මා වෙනුවෙන් එකී තුයිය හැන්දිගේ දීප්ති කුමාර ද සිල්වා යන අය විසින් කරනු ලබන ඕනෑම ක්‍රියාවකට ගනුදෙනුවකට කර්තව්‍යකට මා කිසිදු වගකීමක් නොදරනු ඇති බවත් දන්වා සිටින වගයි.

මානන්ගොඩ ගමගේ තමරා පියසීලි,
ඇටර්නි බල දීමනාකරු.

06-13

---

### ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකාවේ වලහන්දූව, කුරුදුවත්ත, ''සිරිලෙන'' දරන ස්ථානයේ පදිංචි නදීජ කමල් වික්‍රමනායක වන මා සියල්ලන්ගේ ම දනගැනීම පිණිස මෙයින් දන්වා සිටින වග නම්, මා විසින් අත්සන් කළ ගාල්ල රෙජිස්ට්‍රාර් ජෙනරාල් කාර්යාලයේ ඇටර්නි බලපත්‍ර පොතේ 01 කාණ්ඩයේ 54 පත් ඉරුවේ 152 දිනපොතේ අංකය යටතේ 1998.12.14 දින ලියාපදිංචි කරන ලද අංක 6042 සහ 1998.09.30 දිනැති ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ජේ. පී. එම්. ජයවර්ධන විසින් සහතික කරන ලද ඇටර්නි බලපත්‍රය මගින් වලහන්දූව, කුරුදුවත්ත දරන ස්ථානයේ පදිංචි නලින් දමිත් වික්‍රමනායක යන අයට ලබා දී

තිබූ ඇටර්නි බලයන් වහාම ක්‍රියාත්මක වන පරිදි මෙයින් අවලංගු කර නිශ්ප්‍රභා කර බල රහිත කරන බවත් එකී ලේඛන මෙතැන් පටන් බලපැවැත්වීමක් නොවන බවත් එකී බලපත්‍ර යටතේ මින් ඉදිරියට ඔහු විසින් කරනු ලබන කිසිදු කටයුත්තකට මම වග නොකියන බවටත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් එහි මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

නදීජ කමල් වික්‍රමනායක.

''සිරිලෙන'',
කුරුඳුවත්ත,
වලහන්දුව.

2022 ක් වූ මැයි මස 23 වැනි දින දී ය.

06-40

---

## ඇටර්නි බලය ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

කොළඹ 03, ශාන්ත මයිකල් පාරේ, අංක 18 හි ස්වකීය ලියාපදිංචි කාර්යාලය සහිත සමාගම් ලියාපදිංචි අංක පීබී 1173 හිමි 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මනාව සංස්ථාපිත සමාගමක් වන CML - MTD කන්ස්ට්‍රක්ෂන් ලිමිටඩ් වන අප විසින් රාජගිරිය සිල්වා පටුමගේ අංක 44 හි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 197914400165 හිමි මාදුගොඩරාලලාගේ දොන් ලක්මාල් ගුණරත්න සහ දෙහිවල, චාල්ස් පෙදෙසේ අංක 20 ඒ හි පදිංචි මොහොමඩ් රොසාන් ජමීල් (ජාතික හැඳුනුම්පත් අංක 722620054 V හිමි) යන අය වෙත ප්‍රදානය කරන ලද කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. කුලේෂි අනුරංගි විසින් ලියා සහතික කරන ලද අංක 302 සහ 2020 දෙසැම්බර් මස 21 වැනි දින දාතම දරන විශේෂ ඇටර්නි බලය සහ ඉහත සඳහන් CML - MTD කන්ස්ට්‍රක්ෂන් ලිමිටඩ් විසින් ඉහත කී මාදුගොඩරාලලාගේ දොන් ලක්මාල් ගුණරත්න සහ මොහොමඩ් රොසාන් ජමීල් යන අයගේ ප්‍රයෝජනය සඳහා ක්‍රියාත්මක කිරීමට පනවන ලද සියලු සාමාන්‍ය හෝ විශේෂ ඇටර්නි බලතල ද, මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කර අවලංගු කර අහෝසි කර ශුන්‍ය හා බලරහිත කරන ලද බැව් හා එය මෙදින සිට බලපවත්වනු පරිදි සිදුකරනු ලැබූ බවත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් පොදු මහජනතාවටත් මෙයින් දැනුම් දෙමු.

CML - MTD කන්ස්ට්‍රක්ෂන් ලිමිටඩ්,

2022 අප්‍රේල් මස 21 වැනි දින දී ය.

06-41

---

## ඇටර්නි බලය ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

කොළඹ 03, ශාන්ත මයිකල් පාරේ, අංක 18 හි ස්වකීය ලියාපදිංචි කාර්යාලය සහිත සමාගම් ලියාපදිංචි අංක පීබී 1173 හිමි 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මනාව සංස්ථාපිත සමාගමක් වන CML - MTD කන්ස්ට්‍රක්ෂන් ලිමිටඩ් වන අප විසින් රාජගිරිය සිල්වා පටුමගේ අංක 44 හි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 197914400165 හිමි) මාදුගොඩරාලලාගේ දොන් ලක්මාල් ගුණරත්න යන අය වෙත ප්‍රදානය කරන ලද කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. කුලේෂි අනුරංගි විසින් ලියා සහතික කරන ලද අංක 293 සහ 2020 නොවැම්බර් මස 03 වැනි දින දාතම දරන විශේෂ ඇටර්නි බලය සහ ඉහත කී CML - MTD කන්ස්ට්‍රක්ෂන් ලිමිටඩ් විසින් ඉහත සඳහන් මාදුගොඩරාලලාගේ දොන් ලක්මාල් ගුණරත්න යන අයගේ ප්‍රයෝජනය සඳහා ක්‍රියාත්මක කිරීමට පනවන ලද සියලු සාමාන්‍ය හෝ විශේෂ ඇටර්නි බලතල ද, මෙදින සිට බලපවත්වනු ලබන පරිදි මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කර අහෝසි කොට අවලංගුකර ශුන්‍ය සහ බලරහිත කරනු ලැබූ බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් පොදු මහජනතාවටත් මෙයින් දැනුම් දෙමු.

CML - MTD කන්ස්ට්‍රක්ෂන් ලිමිටඩ්,

2022 අප්‍රේල් මස 21 වැනි දින දී ය.

06-42

---

## ඇටර්නි බලය ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

කොළඹ 03, ශාන්ත මයිකල් පාරේ, අංක 18 හි ස්වකීය ලියාපදිංචි කාර්යාලය සහිත සමාගම් ලියාපදිංචි අංක පීබී 1173 හිමි 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මනාව සංස්ථාපිත සමාගමක් වන CML - MTD කන්ස්ට්‍රක්ෂන් ලිමිටඩ් වන අප විසින් රාජගිරිය සිල්වා පටුමගේ අංක 44 හි පදිංචි (ජාතික හැඳුනුම්පත් අංක 197914400165 දරන) මාදුගොඩරාලලාගේ දොන් ලක්මාල් ගුණරත්න සහ දෙහිවල, චාල්ස් පෙදෙසේ අංක 20 ඒ හි පදිංචි (ජාතික හැඳුනුම්පත් අංක 722620054 V) දරන මොහොමඩ් රොසාන් ජමීල් යන අය වෙත ප්‍රදනය කරන ලද කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් සංචලා ප්‍රානමිකා අරංගලගේ විසින් ලියා සහතික කරන ලද අංක 364 සහ 2020 ජූලි මස 03 වැනි දින දාතම දරන විශේෂ ඇටර්නි බලය සහ ඉහත සඳහන් CML - MTD කන්ස්ට්‍රක්ෂන් ලිමිටඩ් විසින් ඉහත කී මාදුගොඩරාලලාගේ දොන් ලක්මාල් ගුණරත්න සහ මොහොමඩ් රොසාන් ජමීල් යන අයගේ ප්‍රයෝජනය සඳහා ක්‍රියාත්මක කිරීමට පනවන ලද සාමාන්‍ය හෝ විශේෂ සියලු ඇටර්නි බලතල ද, මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කර අවලංගු කර අහෝසි කර ශුන්‍යකර හා බලරහිත කරන ලද බැව් හා එය මෙදින සිට බලපවත්වන පරිදි සිදුකරනු ලැබූ බවත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් පොදු මහජනතාවටත් මෙයින් දැනුම් දෙමු.

CML - MTD කන්ස්ට්‍රක්ෂන් ලිමිටඩ්,

2022 අප්‍රේල් මස 21 වැනි දින දී ය.

06-43

## විශේෂ ඇටර්නි බලය අවලංගු කිරීම

අනුරාධපුර, ශ්‍රීමත් මාවතේ, අංක 724 දරන ස්ථානයේ පදිංචි නදීප ලක්මාලි ජේ. ගුණතිලක (ජාතික හැඳුනුම්පත් අංකය 725612478 V) වන මම කොළඹ, නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඒ. ආරියරත්න විසින් 2017 සැප්තැම්බර් මස 14 වැනි දින ලියා සහතික කරන ලද විශේෂ ඇටර්නි බලපත්‍රය මගින් දේවමුල්ලගේ උපනාත් ලලින්ද පෙරේරා (ජාතික හැඳුනුම්පත් අංකය 672290880 V) යන අය වෙත පවරන ලද විශේෂ ඇටර්නි බලය මෙයින් අහෝසිකර අවලංගු කෙරේ. එකී විශේෂ ඇටර්නි බලය දිනපොත් අංක 5179 පත් ඉරු අංක 48 වෙළුම් අංක 208 යටතේ 2017.09.19 වැනි දින දෙල්කඳ රෙජිස්ට්‍රාර් ජෙනරාල් කාර්යාලයේ ලියාපදිංචි කර ඇත. මින් ඉදිරියට ඉහත සඳහන් විශේෂ ඇටර්නි බලපත්‍රය වලංගු නොවන බව ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයට සහ මහජනතාවට මෙයින් දන්වා සිටිමි.

නදීප ලක්මාලි ජේ. ගුණතිලක.

06-47

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9(2) වගන්තිය ප්‍රකාරව, පීක් ඩෙස්ටිනේෂන් මැනේජ්මන්ට් කම්පැනි කළම්බු (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම, 2022 මැයි මස 14 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි 8 වගන්තියේ ප්‍රතිපාදනයන්ට අනුකූලව එහි නාමය ඉන්ට්‍රිපිඩ් ඩීඑම්සී කළම්බු (ප්‍රයිවට්) ලිමිටඩ් වශයෙන් වෙනස් කළ බවට කරනු ලබන නිවේදනයයි.

සමාගමේ කලින් තිබූ නම : පීක් ඩෙස්ටිනේෂන් මැනේජ්මන්ට් කම්පැනි කළම්බු (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 101223
ලියාපදිංචි ලිපිනය : අංක 28, 3 වැනි මහල, ප්‍රෙමියර් පැසිෆික් පිනකල් බිල්ඩිං, ලෝරිස් පෙදෙස, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ 04.
සමාගමේ නව නාමය : ඉන්ට්‍රිපිඩ් ඩීඑම්සී කළම්බු (ප්‍රයිවට්) ලිමිටඩ්,

අධ්‍යක්ෂ මණ්ඩලය අණ පරිදි,

කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු,
ඉන්ට්‍රිපිඩ් ඩීඑම්සී කළම්බු (ප්‍රයිවට්) ලිමිටඩ්.

06-48

---

## 2007 අංක 07 දරන සමාගම් පනතේ 244 (3) වන වගන්තිය ප්‍රකාරව සමාගම් ඒකාබද්ධ කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමයි

එච්එන්බී ෆිනෑන්ස් පීඑල්සී සමාගම, ප්‍රයිම් ෆයිනෑන්ස් පීඑල්සී සමාගම සමග ඒකාබද්ධ කිරීම

එච්එන්බී ෆිනෑන්ස් පීඑල්සී සමාගම (සමාගම් අංකය PB 965 PQ) ප්‍රයිම් ෆයිනෑන්ස් පීඑල්සී සමාගම (සමාගම් අංකය - PB 351 PQ) සමග ඒකාබද්ධ කරන ලද බව හා 2007 අංක 7 දරන සමාගම් පනතේ 244 (1) (අ) වගන්තිය ප්‍රකාරව සමාගම් ඒකාබද්ධ කිරීමේ සහතිකය සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් 2022 මැයි මස 12 වැනි දින නිකුත් කරන ලද බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 244 (3) වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ.

2007 අංක 07 දරන සමාගම් පනතේ 244 (2) වගන්තිය ප්‍රකාරව ඒකාබද්ධ කිරීම 2022 මැයි මස 12 වැනි දින සිට බලාත්මක වන අතර ඉහත සඳහන් ඒකාබද්ධ කරනු ලබන සමාගම් 2022 මැයි මස 12 වැනි දින සිට එච්එන් බී ෆිනෑන්ස් පීඑල්සී සමාගම යන නමින් පවත්වාගෙන යනු ලබයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

එස්එස්පී කෝපරේට් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ්,
සමාගම් ලේකම්වරුන්.
එච්එන්බී ෆිනෑන්ස් පීඑල්සී.

06-49

---

## විශේෂ ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

ඕස්ට්‍රේලියාවේ බැරිස්ටර් සහ සොලිසිටර් චන්ද්‍රා වීරකෝන් මහත්මිය විසින් ලියා සහතික කරන ලද 2007.04.06 වැනි දින දරන විශේෂ ඇටර්නි බලපත්‍රය මගින් මොරටුව, ලක්ෂපතිය, කනකරත්න පෙදෙස, අංක 01 හි පදිංචිව සිටි දැනට 18, ඕක් ට්‍රී ඩ්‍රයිව්, හැම්ප්ටන් පාර්ක් වීඅයිසී, ඕස්ට්‍රේලියාවේ පදිංචිව සිටින මුතුතන්ත්‍රි බස්තියන්ලාගේ චාන්දනී ලලිතා ප්‍රනාන්දු වන මා විසින් කොළඹ 10, මරදාන, ඩීන්ස් පාර, අංක 440 හි පදිංචි විජයසුන්දර මුදියන්සේලාගේ ලක්ෂ්මන් යන අය වෙත පවරා දෙන ලද ඇටර්නි බලතල මෙයින් සම්පූර්ණයෙන් ම අවලංගු කරන ලද බව සියලු දෙනා වෙත මෙයින් දන්වා සිටිමි.

තවද, එකී විජයසුන්දර මුදියන්සේලාගේ ලක්ෂ්මන් විසින් එකී ඇටර්නි බලපත්‍රය මත සිදු කරනු ලබන කිසිදු ක්‍රියාවකට හෝ ගනුදෙනුවකට මෙයින් පසු මා විසින් කිසිදු වගකීමක් නොදරන බවට මෙයින් ප්‍රකාශ කර සිටිමි.

මුතුතන්ත්‍රි බස්තියන්ලාගේ චාන්දනී ලලිතා ප්‍රනාන්දු.

06-53

---

## ඇටර්නි බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

කුරුණෑගල, බෝයගනේ ''ප්‍රභා'' යන ලිපිනයෙහි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 646220866 V හිමි සුජීවා විනෝදනී මහලියන වන මා විසින් කුරුණෑගල, බෝයගනේ ''ප්‍රභා'' හි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 880971670 V හිමි රන්දුනු පතිරන්නැහැලාගේ සාලින්ද ප්‍රියංකර පතිරණ යන අය වෙත ලබා දෙන ලද අංක 3297 සහ 2017.01.09 දිනැති කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. ඇන්ඩෲ ප්‍රේමතුංග මහතා විසින් සහතික කරන ලද විශේෂ ඇටර්නි බලපත්‍රය මෙයින් අවලංගු කොට ප්‍රත්‍යාදිෂ්ඨ කරන බවත්, මින් ඉදිරියට

රන්දුනු පතිරන්නැහැලාගේ සාලින්ද ප්‍රියංකර පතිරණ යන අය විසින් එකී ඇටර්නි බලපත්‍රය යටතේ මාගේ නාමය හෝ මා වෙනුවෙන් හෝ කරනු ලබන්නා වූ කිසිදු ගණුදෙනුවකට හෝ කාර්යයකට මාගේ කිසිදු වගකීමක් නොමැති බවත් ශ්‍රී ලංකා රජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

සුජීවා විනෝදනී මහලියන.

06-58

---

**ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම**

එක්සත් රාජධානියේ UB3 2PC මිඩ්ල් සෙක්ස්, හේස් කොමන්වෙල්ත් ඇවනියු, අංක 28 හි පදිංචි වලර්මති තෙවරාජා (ගුවන් බලපත් අංකය 52719700) සහ සුබ්‍රමනියම් තෙවරාජා (ගුවන් බලපත් අංකය 514035959) වන අප සියල්ලන්ගේ ම දැනගැනීම පිණිස දන්වා සිටින වග නම්, අප විසින් රත්මලාන බොරුපන පාර, හතරවන හරස් වීදිය, අංක 14 හි පදිංචි සුගන්යා බානුගෝපන් (ජාතික හැඳුනුම්පත් අංකය 878421981 V) යන අයට ලබාදී තිබූ, ලන්ඩන් හි සොලිසිටර් ඩී බාලසුබමනියම් විසින් ලියා සහතික කරන ලද 2013 සැප්තැම්බර් මස 25 දිනැති ඇටර්නි බලපත්‍රය මෙම දැන්වීමෙහි සඳහන් දිනයේ සිට බලපවත්වන පරිදි අප විසින් අවලංගු කර නිෂ්ප්‍රභා කර බල රහිත කරන බවත්,

එකී බලපත්‍රය යටතේ මින් ඉදිරියට එකී පුද්ගලයා විසින් කරනු ලබන කිසිදු කටයුත්තක් සඳහා හෝ ඇතුළුවන කිසිදු ගනුදෙනුවක් සඳහා හෝ අප වග නොකියන බවත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් එහි මහජනතාවටත් මෙයින් දැනුම් දෙමු.

වලර්මති තෙවරාජා සහ සුබ්‍රමනියම් තෙවරාජා.

06-83

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**සෙලාන් බැංකුව පීඑල්සී - දඹුල්ල ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

දඹුල්ල සිය ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති සහ සිය ලියාපදිංචි අංක PV 71074 ඇති 2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ ශ්‍රී ලංකාව තුළ යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන ආර්. එස්. ඉම්පෝර්ට්ස් (පීවීටී) ලිමිටඩ් සහ දඹුල්ල පදිංචි රොහාන් රණසිංහ යන අය බැඳුම්කරු/උකස්කරු වශයෙන් ගෙවීම් පැහැර හැර ඇති හෙයින් ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. ද ලීමා විසින් සියල්ල සහතික කරන ලද 2017.01.06 දිනැති බැඳුම්කර අංක 1523, 2017.03.27 දිනැති 1556, 2019.02.12 දිනැති 1831 සහ 2017.08.22 දිනැති 1897 මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත සුරක්ෂිත කර ඇති මෙහි පහත සඳහන් උපලේඛනයෙහි සඳහන් දේපළ,

වර්ෂ **2022 ක් වූ ජුනි මස 29 වැනි දින පෙ. ව. 11.00 ට** සෙලාන් බැංකුව පීඑල්සී දඹුල්ල ශාඛා පරිශ්‍රයේ දී සෙලාන් බැංකුව පීඑල්සී විසින් මා හට පවරණ ලද බලය ප්‍රකාරව මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලැබේ.

මෙම වෙන්දේසිය සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් COVID 19 සම්බන්ධව නිකුත් කර ඇති දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව පවත්වනු ලැබේ.

**1 වන වෙන්දේසිය**

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ උතුර වගපනහ පල්ලේසියපත්තුවේ දඹුල්ල මහ නගර සභා සීමාව තුළ සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ කපුවත්ත ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ තිත්තවැල්ගොල්ල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එම්. එම්. සී. බී. බී. හිරිහාමු විසින් සාදන ලද 2016.12.23 දිනැති අංක 605 දරන සැලැස්මේ නිරූපනය වන අඹගහමුල යාය කොටසක් නමැති ඉඩමේ ලොට් 1 ලකුණු කළ (බලයලත් මිනින්දෝරු පී. බී. ඉලංගසිංහ විසින් සාදන ලද 2007.08.10 දිනැති අංක 2007/PO/336 සැලැස්මේ නිරූපනය වන ලොට් 1 ලකුණු කළ

ඉඩමේ නැවත මැනීමක් වන) බෙද වෙන් කරන ලද ඉඩම් කොටස ප්‍රමාණයෙන් අක්කර දෙකයි (අ. 2) විශාල ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි සියලු දේ සමග ඉඩම.

*දේපළට පිවිසීම.* - දඹුල්ල සෙලාන් බැංකුවේ සිට මාතලේ පාර ඔස්සේ 5.34 km ක් පමණ පැමිණි පසු මෙම විෂයගත දේපළ JC Villa Tourist Hotel පසුකරනවාත් සමග ම වම් පසින් වන්නට පිහිටා ඇත.

**2 වන වෙන්දේසිය - 2022.06.29** වැනි දින පෙ. ව. **11.15** සෙලාන් බැංකුව පීඑල්සී දඹුල්ල ශාඛා පරිශ්‍රයේදී ම විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ උතුර වගපනහ පල්ලේසියපත්තුවේ, දඹුල්ල මහ නගර සභා සීමාව තුළ සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ යාපාගම ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ තිත්තවැල්ගොල්ල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු රංජන් ඒ. දිසානායක විසින් සාදන ලද 2019.07.22 දිනැති අංක 0701 සැලැස්මේ නිරූපනය වන ගලගාවා වත්ත සහ දේවාලේ ලන්දේ යාය නමැති සහ හඳුන්වනු ලබන ඉඩමේ ලොට් 1 ලකුණු කළ ඉඩම් කොටස ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් හතයි දශම හයක් (රූ. 1, පර්. 07.6) විශාල දේපළට සම්බන්ධ මාර්ග ප්‍රවේශය සහ ගස්, වගා සහ එහි පිහිටි සියලු දේ සමග ඉඩම.

*දේපළට පිවිසීම.* - දඹුල්ල සෙලාන් බැංකුවේ සිට මාතලේ පාර ඔස්සේ 5 km ක් පමණ දුරින් ඇති කපුවත්ත වැව පාර දක්වා පැමිණ වමට හැරී කපුවත්ත පාරෙන් මීටර් 140ක් පැමිණි පසු T හංදියක් හමුවේ. එම හංදියෙන් වමට හැරී මීටර් 75ක් පමණ බොරළු පාරෙන් පැමිණි පසු වම් පසින් වන්නට මෙම විෂයගත දේපළ පිහිටා ඇත.

*යෝජනා සම්මුති දැන්වීම.* - 2021.02.12 දිනැති රජයේ ගැසට් පත්‍රයේ ද, අයිලන්ඩ්, අරුණ සහ තිනක්කරන් පුවත්පත් හි 2020.12.09 පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10%,
2. පළාත් අධිකාරියේ බදු සඳහා 1%,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2.5%,
4. විකුණුම් කොන්දේසි පත්‍රය සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000,
5. ලිපිකරු සහ සෝෂකගේ ගාස්තු,
6. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය.

ගැණුම් මිලෙන් 90% ක් ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු හෝ ගාස්තු වෙතොත් ඒ වාද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවිය යුතු ය. ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් නියමිත කාලසීමාව ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

*හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වෙනත් වැඩිදුර විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.* අංශ ප්‍රධානී නීති, සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාළු පාර, කොළඹ 03.

දුරකතන අංක : 011 2456485, 011-2456479, 011- 2456473.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

චන්දිමා ප්‍රියදර්ශණී ගමගේ,
බලයලත් වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

අංක 09, අයි. හයිලෙවල් පාර,
සර්වෝදය මාවත, පනාගොඩ, හෝමාගම.
දුරකථන අංක : 071 4318252.

06-56

---

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - මාරවිල ශාඛාව**
**(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

අමානා බැන්ක් පී එල් සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මා වෙත පවරන ලද බලය ප්‍රකාරව නාගූර් ලෙබ්බෙ හයිඩර් අලි සහ හයිඩර් අලි මොහොමඩ් මුනාස් යන අය බන්ධනදයින් වශයෙන් අමානා බැන්ක් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට උකස් කර ඇති පහත විස්තර කර ඇති දේපළ එම දේපළ පිහිටි ස්ථානයේ දී **2022 ක් වූ ජුනි මස 21 වැනි දින පෙ. ව. 10.00** ට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළ විස්තරය. -*

මඩකලපුව දිස්ත්‍රික්කයේ කොරලෙයිපත්තු මධ්‍යම ප්‍රාදේශීය මහ ලේකම් කොට්ඨාසයේ කොරලෙයිපත්තු ප්‍රාදේශීය සභා සීමාවන් තුළ ඔඩ්ඩමාවඩි ගමේ හුද පාරේ (Hudah Road) පිහිටි ඉඩමට බලයලත් මානක කේ. ඒ. ඊ. කේ. තිස්සවීරසිංහ විසින් සාදන ලද 2014.06.18 වැනි දින අංක 587/2014 දරන පිඹුරේ නිරූපිත බෙද වෙන් කළ ඉඩම් කොටස හා එහි තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ ඇතුළු අනෙකුත් සියලු දේ සමග ඉඩමේ ප්‍රමාණය පර්. 15.46

*දේපළට පිවිසීම.*- වාලච්චෙනායි හන්දියේ සිට ත්‍රිකුණාමලය පාරේ කි. මී. 1.1ක් පමණ ගමන් ගෙන දකුණට හැරී හුද පල්ලිය පාරට පිවිස එම පාරේ මීටර් 200ක් පමණ ගමන් ගත් විට අදාළ දේපළ මෙම පාරේ දකුණු පසින් පාරට මායිම්ව පිහිටා තිබේ.

යෝජනා සම්මුතිය සඳහා 2018.06.22 වැනි දින රජයේ *ගැසට්* පත්‍රය ද, දිවයින, අයිලන්ඩ් හා වීරකේසරි පුවත්පත් ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය .*- මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු සහ වෙනත් ගාස්තු ඇත්නම් එම මුදල,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය සහ අනෙකුත් ගාස්තු,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 1,000.00,
6. විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා නොතාරිස් ගාස්තුව රු. 3,000.00.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත අමානා බැන්ක් පීඑල්සී වෙත ගෙවිය යුතු වේ.

*හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න.*- ප්‍රධානී ණය අයකිරීම්, අමානා බැන්ක් පී. එල්. සී., අංක 486, ගාලු පාර, කොළඹ 03.

දුරකතන අංක : 011 - 7756000 දිගුව 2112.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු
පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ මහනුවර,
දුරකථන අංක : 081 2210595/071 - 8446374 / 071- 4962449.

06-67

---

**අමානා බැන්ක් පී.එල්.සී. - කඳුරුවෙල ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

අමානා බැන්ක් පී එල් සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මා වෙත පවරන ලද බලය ප්‍රකාරව නිව් ගෝල්ඩන් රයිස් මිල්ස් යන නාමය විලාසය සහ අභිධානය යටතේ ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යනු ලබන පිහිල්ලතැන්නේ ගෙදර නිසාම්දීන් මුම්තාස් මොහොමඩ් සහ සියඹලාගෙදර රෂීඩ් මොහමඩ් නලීස් යන අය බන්ධනදයින් වශයෙන් අමානා බැන්ක් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට උකස් කර ඇති පහත විස්තර කර ඇති දේපළ එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*1 වන විකිණීම.* - **2022 ක් වූ ජුනි මස 28 වැනි දින පෙ. ව. 10.00 ට**

*දේපළ විස්තරය.* -

මහනුවර දිස්ත්‍රික්කයේ, පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පූජාපිටිය ප්‍රාදේශීය සභා සීමාවන් තුළ මුල්ලේගම උතුරු ග්‍රාම නිලධාරී වසම මුල්ලේගම ගමේ පිහිටි ''බැද්දගේ අරඹ'' නමැති ඉඩමට මාතලේ බලයලත් මානක එම් රාජසේකරන් විසින් සාදන ලද 2015.01.17 වැනි දින අංක 7601 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන් කළ ලොට් 1 A 2 දරන ඉඩම් කොටස හා එහි තුළ පිහිටි දෙමහල් නිවාස ගොඩනැගිල්ල ගහ කොළ වගාව ඇතුළු අනෙකුත් සියලු දේ. ඉඩමේ ප්‍රමාණය පර්චස් 23.75

*2 වන විකිණීම .*- **2022 ක් වූ ජුනි මස 28 වැනි දින පෙ. ව. 10.15 ට**

*දේපළ විස්තරය .*-

මහනුවර දිස්ත්‍රික්කයේ, පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පූජාපිටිය ප්‍රාදේශීය සභා සීමාවන් තුළ මුල්ලේගම උතුරු ග්‍රාම නිලධාරී වසම මුල්ලේගම ගමේ පිහිටි ''බැද්දගේ අරඹ'' නමැති ඉඩමට මාතලේ බලයලත් මානක එම්. රාජසේකරන් විසින් සාදන ලද 2015.01.17 වැනි දින අංක 7601 දරන පිඹුරේ නිරූපිත බෙද වෙන් කළ ලොට් 1A1 දරන ඉඩම් කොටස හා එහි තුළ පිහිටි දෙමහල් නිවාස ගොඩනැගිල්ල ගහකොළ වගාව ඇතුළු අනෙකුත් සියළු දේ. ඉඩමේ ප්‍රමාණය පර්චස් 23.75

*දේපළට පිවිසීම.*- මහනුවර නගරයේ කටුගස්තොට සිට මාතලේ පාරේ කි. මී. 07.5ක් පමණ අඹතැන්න හන්දිය දක්වා පැමිණ වමට හැරී පූජාපිටිය පාරට පිවිස එම පාරේ කි. මී. 2.1ක් පමණ නාතර් ෆීල්ඩ් ඉන්ටර්නැෂනල් විදුහල (Nather Field Inter National School) පසුකළ වහාම දකුණට හැරී එම පාරේ මීටර් 10ක් පමණ ගත් විට අදල දේපළ මෙම පාරේ දකුණු පසින් පාරට මායිම්ව පිහිටා තිබේ.

යෝජනා සම්මුතිය සඳහා 2019.07.27 වැනි දින රජයේ *ගැසට්* පත්‍රය ද 2019.09.27 වැනි දින දිවයින, අයිලන්ඩ් හා වීරකේසරී පුවත්පත් ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය .*- මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු සහ වෙනත් ගාස්තු ඇත්නම් එම මුදල,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),

4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය සහ අනෙකුත් ගාස්තු,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 1,000.00,
6. විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා නොතාරිස් ගාස්තුව රු. 3,000.00.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත අමානා බැන්ක් පීඑල්සී වෙත ගෙවිය යුතු වේ.

*හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න.-* ප්‍රධානී ණය අයකිරීම් අංශය, අමානා බැන්ක් පී. එල්. සී., අංක 450, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011 7756000 දිගුව 2112.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු
පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ මහනුවර,
දුරකථන අංක : 081 2210595/071 - 8446374 / 071- 4962449.

06-68

---

මෙම වෙන්දේසිය COVID -19 ක්‍රියා පිළිවෙතට අනුගත වෙමින් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව පවත්වනු ලැබේ

**හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - කිරිඳිවෙල ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මා වෙත පවරන ලද බලය ප්‍රකාරව විතානගේ දෝන ඉනෝකා නිශාන්ති යන අය ණයකරු වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පී එල් සී වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට උකස් කර ඇති පහත විස්තර කරන ලද දේපළ **2022 ක්වූ ජුනි මස 23 වැනි දින පෙ.ව . 10.30** ට දේපල පිහිටි ස්ථානයේ දී ආරම්භ වන ප්‍රසිද්ධ වෙන්දේසියේදී මා විසින් විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ ගඟබඩ පත්තුවේ දෙම්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ දොම්පේ ප්‍රාදේශීය සභා පරිපාලන සීමාව තුළ අංක 394 C නන්දාරාම පෙදෙස දරන ග්‍රාමනිලධාරී වසම තුළ මන්ඩාවල ගමෙහි පිහිටි ''දුම්මලහින්න'' නමැති ඉඩමට සහ පරිශ්‍රයට බලයලත් මිනින්දෝරු එස්. එම්. චන්ද්‍රසිරි විසින් සාදන ලද අංක 5000 හා 2014.03.11 දින දරන පිඹුරේ දක්වෙන බෙද වෙන් කරන ලද ලොට් ඒ දරන ඉඩම් කොටස, සහ එහි තුළ පිහිටි ගොඩනැගිලි ගහකොළ වගාව ඇතුළු අනෙකුත් සියලු දේ. ඉඩමේ ප්‍රමාණය පර්චස් 28.7

*දේපළට පිවිසීම.-* හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. කිරිඳිවෙල ශාඛා පරිශ්‍රයේ සිට කිරිඳිවෙල - රදවාන මාර්ගයේ රදවාන දෙසට මීටර් 600ක් පමණ ගමන් ගත් පසු මෙම පාරේ වම් පසින් කාපට් එලන ලද පැපිලියාන පාර හමුවේ. මෙම පැපිලියාන පාරේ කි. මී. 2.8ක් පමණ ගමන් ගත් පසු හමුවන තුන්මන් හන්දියෙන් දකුණට හැරී එම පාරේ කි. මී. 2.4ක් පමණ ගමන්කර මණ්ඩාවල ශ්‍රී ජයවර්ධනාරාම පන්සල පසුකර වහාම වම් දෙසට පිහිටි බොරළු පාරට පිවිස එම පාරේ මීටර් 50ක් පමණ ගමන් ගත් විට මෙම පාරේ දකුණු පසින් පිහිටි නවීන පන්නයේ දෙමහල් නිවාස ගොඩනැගිල්ල අදාල දේපළ වේ.

යෝජනා සම්මුතිය සඳහා 2021.05.07 වැනි දින රජයේ ගැසට් පත්‍රය හා 2021.10.07 වැනි දින මව්බිම, ඩේලිමිරර් හා තිනක්කුරල් පුවත්පත් ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය .-* මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 1,500.00,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000.00,

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

*හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න :* ජ්‍යෙෂ්ඨ කළමනාකරු (වාණිජ අයකිරීම් අංශය) හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011 2661835, 011- 2661836.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු
පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ මහනුවර,
දුරකථන අංක : 076 1 375 993/071 4962449/071 8 446 374.

06-70

## කාර්ගිල්ස් බැන්ක් ලිමිටඩ්

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

එනම් රිෆ්ස් එඩ්ජ් රිසෝර්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් උකස්කරු වශයෙන් කාර්ගිල්ස් බැන්ක් ලිමිටඩ් (ලියාපදිංචි අංක PB 4847 දරන) නමට ප්‍රසිද්ධ නොතාරිස් කේ. එස්. පී. ඩබ්ලිව්. ජයවීර විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2018.01.19 දිනැති අංක 6371 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කොට ඇපකොට මෙහි උපලේඛනයේ විස්තර කොට ඇති දේපල සහ පරිශ්‍රය ඇපයට තබාගෙන ලබා දුන් ණය පහසුකම මත ගෙවිය යුතු මුදල් ආපසු ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

කාර්ගිල්ස් බැන්ක් ලිමිටඩ් විසින් මා වෙත පවරන ලද බලතල අනුව පහත සඳහන් දේපල **2022 ජුනි මස 27 වැනි දින පෙරවරු 10.00** ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ වත්තල ප්‍රාදේශීය සභා සීමාව තුළ සහ උස්වැටකෙයියාව ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ පරණ අම්බලමෙහි පිහිටි කොළඹ පාර (උස්වැටකෙයියාව) වරිපනම් අංක 300, 304 දරන ස්ථානයෙහි ''දොම්බගහවත්තේ කොටස'' සහ ''දොඹගහවත්ත, ගල්බානතොටේවත්ත සහ ''මුණමල්ගහවතුපංගුව'' සහ දැන් ''රිෆ් එඩ්ජ් හොටෙල්'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් මැන සාදන ලද අංක 6490/9000 සහ 2012.05.07 දින දරන පිඹුර (බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් 2007.04.19 වැනි දින මැන සාදන ලද අංක 4575/9000 දරන පිඹුරෙහි කැබලි අංක A 2012.02.23 දින දරන අංක 6430/9000 දරන පිඹුරෙහි කැබලි අංක X සහ 2012.02.23 දින දරන අංක 6430 A 9000 දරන පිඹුරෙහි කැබලි අංක Y දරන කොටස් නැවත මැන ඒකාබද්ධ කරන ලද) ප්‍රකාර බෙද වෙන් කරන ලද කැබලි අංක 1 දරන ඉඩම් කොටස සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ වැවිලි සහ සෑම සියලු දෙයක් ම වන අතර මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම්/පත්‍රිරු අංක L 44/03 හි ලියාපදිංචි කර ඇත.

ප්‍රමාණයෙන් රූඩ් තුනයි පර්චස් තිස් පහයි දශම තුනයි දෙකක් (අ. 0, රූ. 3,පර්. 35.32)

*දේපළට පිවිසීම.* - කොළඹ මහනුවර ( A 1) මාර්ගය ඔස්සේ ගොස් කැළණි පාලම ද පසුකර වම්පසට ඇති පෑලියගොඩ - පුත්තලම (A 3) ප්‍රධාන මාර්ගයට හැරී කි. මී. 4.3 ක පමණ දුරක් ගොස් වත්තල තැපැල් කාර්යාලය ආසන්නයට පැමිණ වම්පසට ඇති ඇලකන්ද මාර්ගයට හැරී එම මාර්ගය දිගේ තවත් කි. මී. 2.7ක පමණ දුරක් ගොස් ඇලකන්ද මංසන්ධිය දක්වා පැමිණ බෝපිටිය මාර්ගයට පිවිසෙන්න. එම බෝපිටිය මාර්ගය ඔස්සේ තවත් කි. මී. 7.5 ක පමණ දුරක් ගිය විට අදළ දේපළ දෙක මාර්ගයේ දෙපසින් පිහිටා ඇත. කොළඹ සිට කි. මී. 15.25 ක දුරකින් පිහිටා ඇත.

*යෝජනා සම්මුති දැන්වීම.* - රජයේ ගැසට් පත්‍රයේ හා දිවයින, ඩේලිනිව්ස් සහ තිනකරන් යන පුවත්පත්වල 2021.03.19 වැනි දින පළවී ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද, 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), සමග අදාල බදු මුදල 4. සියලුම ප්‍රචාරක වියදම් සමග වෙන්දේසිය සඳහා වන සියලු මුදල්, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 1,000.00 6. විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා නොතාරිස් ගාස්තු.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත කාර්ගිල්ස් බැන්ක් ලිමිටඩ් වෙත ගෙවා නිමකළ යුතුයි.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30ක් ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

වැඩි විස්තර සඳහා විමසන්න. අයකර ගැනීම්, ප්‍රධානී, කාර්ගිල්ස් බැන්ක් ලිමිටඩ්, අංක 696, ගාලු පාර, කොළඹ 03. දුරකථනය 011- 7640450.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

තුසිත් කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී ඇන්ඩ් එච්. ඔක්ෂන්,
50/3, විහාර මාවත, කොලොන්නාව,
දුරකථන අංක 011 - 3068185, 011- 2572940.

06-08

## කාර්ගිල්ස් බැන්ක් ලිමිටඩ්

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

එනම් රිෆ්ස් එඩ්ජ් රිසෝර්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් බන්ධනදයි වශයෙන් කාර්ගිල්ස් බැන්ක් ලිමිටඩ් (ලියාපදිංචි අංක PB 4847 දරන) නමට ප්‍රසිද්ධ නොතාරිස් කේ. එස්. පී. ඩබ්ලිව්. ජයවීර විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2018.01.19 දිනැති අංක 6369 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කොට ඇපකොට මෙහි උපලේඛනයේ විස්තර කොට ඇති දේපල සහ පරිශ්‍රය ඇපයට තබාගෙන ලබා දුන් ණය පහසුකම මත ගෙවිය යුතු මුදල් ආපසු ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

කාර්ගිල්ස් බැන්ක් ලිමිටඩ් විසින් මා වෙත පවරන ලද බලතල අනුව පහත සඳහන් දේපල **2022 ජුනි මස 27 වැනි දින පෙරවරු 9.30 ට** එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ වත්තල ප්‍රාදේශීය සභා සීමාව තුළ සහ උස්වැටකෙයියාව ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ පරණ අම්බලමෙහි පිහිටි කොළඹ පාරේ වරිපනම් අංක 304 දරන ස්ථානයෙහි ''දෙඹගහවත්ත'' ''දෙඹගහවත්තේ කොටස ගල්බානතොටේ ගල්බානතොටවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් මැන සාදන ලද අංක 6424A/9000 සහ 2012.02.29 දින දරන පිඹුර (බලයලත් මිනින්දෙරු කේ. ඊ. ජේ. බී. පෙරේරා විසින් 1994.05.25 වැනි දින මැන සාදන ලද අංක 3509 දරන පිඹුරෙහි කැබලි අංක 1 සහ 2, බලයලත් මිනින්දෝරු එම්. ඩී. ජේ. වී. පෙරේරා විසින් 1996.09.10 වැනි දින මැන සාදන ලද අංක 15125 දරන පිඹුරෙහි කැබලි අංක A, බලයලත් මිනින්දෝරු කේ. ඊ. ජේ. බී. පෙරේරා විසින් 1994.05.25 වැනි දින මැන සාදන ලද අංක 3508 දරන පිඹුරෙහි කැබලි අංක 1 සහ 2 බලයලත් මිනින්දෝරු එම්. ඩී. ජේ. වී. පෙරේරා විසින් 1981.08.08 වැනි දින මැන සාදන ලද අංක 6123 දරන පිඹුරෙහි කැබලි අංක 2 සහ බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් 2007.02.09 වැනි දින මැන සාදන ලද අංක 4479/9000 දරන පිඹුරෙහි කැබලි අංක X 1, X 2, X 3 සහ X 4 දරන කොටස් නැවත මැන ඒකාබද්ධ කරන ලද) ප්‍රකාර බෙද වෙන් කරන ලද කැබලි අංක X 1 දරන ඉඩම් සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ වැවිලි සහ සෑම සියලු දෙයක් ම වන අතර මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම්/පත්ඉරු අංක L 44/04 හි ලියාපදිංචි කර ඇත.

ප්‍රමාණයෙන් අක්කර හයයි පර්චස් දහඅටක් (අ. 6, රූ. 0, පර්. 18)

*දේපළට පිවිසීම.* - කොළඹ මහනුවර (A1) මාර්ගය ඔස්සේ ගොස් කැලණි පාලම ද පසුකර වම්පසට ඇති පැලියගොඩ - පුත්තලම (A 3) ප්‍රධාන මාර්ගයට හැරී කි. මී. 4.3 ක පමණ දුරක් ගොස් වත්තල තැපැල් කාර්යාලය ආසන්නයට පැමිණ වම්පසට ඇති ඇලකන්ද මාර්ගයට හැරී එම මාර්ගය දිගේ තවත් කි. මී. 2.7ක පමණ දුරක් ගොස් ඇලකන්ද මංසන්ධිය දක්වා පැමිණ බෝපිටිය මාර්ගයට පිවිසෙන්න. එම බෝපිටිය මාර්ගය ඔස්සේ තවත් කි. මී. 7.5 ක පමණ දුරක් ගිය විට අදළ දේපළ දෙක මාර්ගයේ දෙපසින් පිහිටා ඇත. කොළඹ සිට කි. මී. 15.25 ක දුරකින් පිහිටා ඇත.

*යෝජනා සම්මුති දැන්වීම. - රජයේ ගැසට් පත්‍රයේ සහ දිවයින,* ඩේලිනිව්ස් සහ තිනකරන් යන පුවත්පත්වල 2021.03.19 වැනි දින පළවී ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද, 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), සමග අදාල බදු මුදල 4. සියලුම ප්‍රචාරක වියදම් සමග වෙන්දේසිය සඳහා වන සියලු මුදල්, 5. ලිපිකරු සහ සෝෂක වේතය රු. 1,000, 6. විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා නොතාරිස් ගාස්තු.

ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත කාර්ගිල්ස් බැන්ක් ලිමිටඩ් වෙත ගෙවා නිමකළ යුතුයි.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30ක් ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

වැඩි විස්තර සඳහා විමසන්න. අයකර ගැනීම්, ප්‍රධානී, කාර්ගිල්ස් බැන්ක් ලිමිටඩ්, අංක 696, ගාලු පාර, කොළඹ 03. දුරකථනය 011- 7640450.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

තුසිත් කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී ඇන්ඩ් එච්. ඔක්ෂන්,
50/3, විහාර මාවත, කොලොන්නාව,
දුරකථන අංක 011 - 3068185, 011- 2572940.

06-09

## සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

කේ. එල්. ඩී. පෙරේරා.
ගිණුම් අංක : 1037 5483 4604.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2018.09.27 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් හැට එක් ලක්ෂ අසූ එක් දහස් හයසිය හතරයි ශත හතලිහක (රු. 6,181,604.40) මුදල ද, 2018 සැප්තැම්බර් මස 11 වැනි දින අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හැට ලක්ෂ දොළොස් දහස් දහ අටයි ශත හතක (රු. 6,012,018.07) මුදලක් සඳහා වාර්ෂිකව සියයට නමයයි දශම පහක් (9.5%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2019.03.01 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* 2019.02.21 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි **2022.06.23 වැනි දින පෙ. ව. 11.00** ට පිහිටි ස්ථානයේදී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාවන් තුළ සහ කොළඹ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, මහවත්ත ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, වෝඩ් අංක 3, නාගලගම් වීදියේ පිහිටි නාගලගම්වීදිය අංක 243 දරන පරිශ්‍රයන්, බලයලත් මානක තැන එච්. පී. ඒ. ජයවික්‍රම යන අය විසින් සාදන ලද 2011 මැයි 10 දාතම හා අංක 12786 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය බෙදාවෙන්කොට ලොට් 67A වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : නාගලගම්වීදිය අංක 247 දරන පරිශ්‍රයන්, නැගෙනහිරට : නාගලගම්වීදිය, දකුණට : නාගලගම්වීදිය අංක 239 සහ 235 දරන පරිශ්‍රයන් සහ බස්නාහිරට : අංක 365 දරන පිඹුරේ ලොට් D යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් හතරයි දශම දෙකයි පහක් (A:0, R:0, P:4.25) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 12786 දරන පිඹුරට අනුවය.

එකී ලොට් 67A වඩා නිවැරදිව පහතින් මැනවින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි,

එකී වෝඩ් අංක 3, නාගලගම්වීදියේ පිහිටි බලයලත් මානක තැන වී. ඒ. එල්. සේනාරත්න යන අය විසින් සාදන ලද 1952 අගෝස්තු 17 දාතම හා අංක 365 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය බෙදාවෙන්කොට ලොට් 67 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 66, නැගෙනහිරට : නාගලගම්වීදිය, දකුණට : තණ පිටිය සහ බස්නාහිරට : ලොට් D සහ තණ පිටිය යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් හතරයි දශම දෙකයි පහක් (A:0, R:0, P:4.25) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 365 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව A 1036/13 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

06-01

---

## නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විවිධාන) පනතේ 09 වන වගන්තිය ප්‍රකාරව වෙන්දේසිය පිළිබඳ දැන්වීමයි

#### 1 වන උපලේඛනය

උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, ඇලහැර ප්‍රාදේශීය සභා සීමාව තුළ, පොළොන්නරුව, දියබෙදුම, කටුකැලියාව, සිංහ ලංකා හාල් මෝල පරිශ්‍රයේ තබා හෝ රැස්කර තිබෙන්නා වූ එකී සමාගමට අයිති මෙහි පහතින් ලැයිස්තුගත කර ඇති යන්ත්‍රෝපකරණ, වෙනත් යන්ත්‍ර කොටස්, අමුද්‍රව්‍ය, නිමි සහ නොනිමි භාණ්ඩ, කෙරීගෙන යන වැඩ කොටස්, වෙනත් සියලුම භාණ්ඩ, ගෘහ උපකරණ, සවිකිරීම් සහ දේවල් සහ යම් කවර ම වූ විස්තර සහිත වෙනත් සියලුම චංචල දේපළ (ඒ සියල්ලම සාමූහික වශයෙන් "එකී බන්ධනදායීගේ යන්ත්‍රෝපකරණ, වෙළඳ බඩු තොගය සහ ද්‍රව්‍ය" වශයෙන් හඳුන්වන.) ඇතුළුව සහ එකී බන්ධනදායි විසින්/උකස්කරු විසින් ඉහත කී දිස්ත්‍රික්කය තුළ වර්තමානයේ දී හෝ මෙහි මින්මතු ඕනෑම විටක දී හෝ කලින් කලට ව්‍යාපාරික කටයුතු කරගෙන යමින් සිටින සියලුම වෙනත් ගුදම්, ගබඩා සහ පරිශ්‍රයන් තුළ තිබෙන්නා වූ ද, සහ එකී බන්ධනදායිගේ/උකස්කරුගේ යන්ත්‍රෝපකරණ, ව්‍යාපාර බඩුතොගය සහ බඩුබාහිරාදිය සහ වෙනත් යම් කවරම වූ ආකාරයක විස්තර සහිත චංචල දේපළ සහ මෙහි මින්මතු මෙම ලියවිල්ල බලාත්මකව පවතින කාලය තුළ කලින්

කලට හෝ සෑම කල්හිම රැගෙන යන, තැන්පත් කරන එකී බන්ධනදායි විසින්/උකස්කරු විසින් මෙහි මින්මතු ඕනෑම විටක දී සහ කලින් කලට ඉවත් කරගෙන ව්‍යාපාර කටයුතු කරන සියලුම හෝ යම් වෙනත් ස්ථානයක එක්ව සහ වෙන් වෙන්ව තිබෙන්නා වූ එකී සමාගමට අයිති යන්ත්‍රසූත්‍ර සහ බඩුබාහිරාදිය සහ එකී බන්ධනදායීගේ/උකස්කරුගේ වෙළඳාම තොග යන්ත්‍රෝපකරණ, ව්‍යාපාර, ද්‍රව්‍ය සහ උපාංග සහ වෙනත් චංචල දේපළ ද සමග ය.

| *අයිතම අනු අංකය* | *යන්ත්‍ර වර්ගය* | *නිෂ්පාදන වර්ගය මාදිලිය සහ අනු අංකය* | *අයිතම සංඛ්‍යාව* |
|---|---|---|---|
| 01 | ඇඹරීම් වෙන්කරණය - (Milling Separator) | මාදිලිය:SF1 1000 A-T<br>අනු අංකය : 6101610-043 | 01 |
| 02 | ගුරුත්ව වෙන්කරණය (Gravity Separator Dostoner) | මාදිලිය : SGA 10B (2) T<br>අනු අංකය : 3871701-004 & 005 | 02 |
| 03 | වී හස්කය සහ චූෂකය (Paddy Husker & Aspirator) | මාදිලිය : HU 10FHFA (2) - T [හස්කකය (Husker)]<br>HA 10WFA - T [චූෂකය (Aspirator)]<br>අනු අංකය : 2781701-004 සහ 2111701-005 | 02 |
| 04 | වී වෙන්කරණය (Paddy Separator) | මාදිලිය : PS400D(2) - T<br>අනු අංකය : 2831610 - 059 | 01 |
| 05 | සිරස් සහල් ධවලකය (Vertical Rice Whitener) | මාදිලිය : VAT10AB(2)-TA<br>අනු අංකය : 4311611-082, 4311612-082, 4311612-090 | 03 |
| 06 | භ්‍රමණ ශිෂ්ටර යතුර (Rotary Sifter) | මාදිලිය : ST527RSD-T1<br>අනු අංකය : 4621610-087, 4621610-088 | 02 |
| 07 | සහල් ඔපකරණය (Rice Polisher) | මාදිලිය : KB75HS(2) T<br>අනු අංකය : 3231701-003, 3231701-004 | 02 |
| 08 | ආයාම වර්ගකරණය (Length Grader) | මාදිලිය : LRG306FA-T<br>අනු අංකය : 4901703-003, 4901703-004 | 02 |
| 09 | ත්‍රිවර්ණ දෘෂ්ටි විභාජකය (Trichromatic Full Color Optical Sorter) | මාදිලිය : REZS6540DIS<br>අනු අංකය : S41630155 | 01 |
| 10 | යන්ත්‍ර පාලක පැනලය (Motor control Panel) | මාදිලිය:<br>අනු අංකය : | 01 |
| 11 | ද්වීත්ව කිරුම් සහිත අර්ධ ස්වයංක්‍රීය බැගින් මැෂිම (Semi-Automatic Bagging Maching with double Weigher) | Model :- 1A-BFM-03<br>Serial No :- | 01 |
| 12 | තෙකලා ඩීසල් ජනක යන්ත්‍රය (Three Phase Diesel Generator) | Model : SDE80LS3<br>Serial No:- | 01 |
| 13 | එලිවේටර් (Elevators) | Model:-<br>Serial No:- | 15 |

**2 වන උපලේඛනය**

උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, ඇලහැර ප්‍රාදේශීය සභා සීමාව තුළ, පොළොන්නරුව නගරයේ, දිබෙදුම, දියබෙදුම සහ කටුකෙලියාව ෆාම් හවුස් අංක 97 දරන ස්ථානයේ, දියබෙදුම, කටුකැලියාව, සිංහ ලංකා බඩු ගබඩා පරිශ්‍රයේ තබා තිබෙන සහල් සහ වී වෙළඳ බඩු තොගය සහ එකී බන්ධනදායී විසින්/උකස්කරු විසින් ඉහත කී දිස්ත්‍රික්කය තුළ වර්තමානයේ දී හෝ මෙහි මින්මතු ඕනෑම විටක දී හෝ කලින් කලට ව්‍යාපාරික කටයුතු කරගෙන යමින් සිටින සියලුම වෙනත් ගුදම්, ගබඩා සහ පරිශ්‍රයන් තුළ තිබෙන්නා වූ ද, සහ එකී බන්ධනදායිගේ/උකස්කරුගේ ව්‍යාපාර බඩුතොගය සහ බඩු බාහිරාදිය සහ වෙනත් යම් කවරම වූ ආකාරයක විස්තර සහිත චංචල දේපළ සහ මෙහි මින්මතු මෙම ලියවිල්ල බලාත්මකව පවතින කාලය තුළ කලින් කලට හෝ සෑම කල්හිම රැගෙන යන, තැන්පත් කරන එකී බන්ධනදායි විසින්/උකස්කරු විසින් මෙහි මින්මතු ඕනෑම විටක දී සහ කලින් කලට ඉවත් කරගෙන ව්‍යාපාර කටයුතු කරන සියලුම හෝ යම් වෙනත් ස්ථානයක එක්ව සහ වෙන් වෙන්ව තිබෙන්නා වූ එකී බඩු බාහිරාදිය සහ එකී බන්ධනදායීගේ/උකස්කරුගේ වෙළඳාම ව්‍යාපාර, ද්‍රව්‍ය සහ වෙනත් චංචල දේපළ ද සමග ය.

පොළොන්නරුව ප්‍රසිද්ධ නොතාරිස් උපාසක ගෙදර හිමාලී පුෂ්පකාන්ති ප්‍රඥාවර්ධන විසින් සහතික කරන ලද අංක 1537 සහ 1538 සහ 2018 අගෝස්තු මස 10 දින දරන උකස් බැඳුම්කරය මගින් මෙහි ඉහත පළමුවන සහ දෙවන උපලේඛනවල සවිස්තරව දක්වා ඇති පරිදි සිංහ ලංකා වී මෝලේ සවිකර තිබෙන යන්ත්‍රෝපකරණ සහ එහි තිබෙන සහල් සහ වී වල ව්‍යාපාර බඩු තොගය සහ අනෙකුත් ද්‍රව්‍ය ලූණුගම විදානෙලාගේ නදීෂ සුරාජ් සමිත ජයවික්‍රම, ලූණුගම විදානෙලාගේ සුනිල් සහ ලූණුගම විදානෙලාගේ ශානක විරාජ් ජයවික්‍රම යන අය විසින් ලබාගත් මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් බන්ධනදායින්/උකස්කරුවන් ලෙස ක්‍රියාකරමින් ඉහත කී ලූණුගම විදානෙලාගේ නදීෂ සුරාජ් සමිත ජයවික්‍රම, ලූණුගම විදානෙලාගේ සුනිල් සහ ලූණුගම විදානෙලාගේ ශානක විරාජ් ජයවික්‍රම යන අය විසින් කොළඹ 02, යූනියන් පෙදෙසේ, අංක 242 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පීඑල්සී නමින් උකස් කොට ඇපයට තබා ඇති බැවින් ද, එකී බැඳුම්කරය මගින් ඇප තබන ලද ඉහත කී මූල්‍ය පහසුකම් මත ආපසු ගෙවීම ඉහත කී ලූණුගම විදානෙලාගේ නදීෂ සුරාජ් සමිත ජයවික්‍රම, ලූණුගම විදානෙලාගේ සුනිල් සහ ලූණුගම විදානෙලාගේ ශානක විරාජ් ජයවික්‍රම යන අය විසින් පැහැර හැරීම කර ඇති බැවින්ද, නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පී එල් සී විසින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාරව,

**1 වන උපලේඛනයේ දැක්වෙන දේපළ වර්ෂ 2022 ක් වූ ජූලි මස 06 වැනි දින පෙ.ව. 09.00 ට**
**2 වන උපලේඛනයේ දැක්වෙන දේපළ වර්ෂ 2022 ක් වූ ජූලි මස 06 වැනි දින පෙ. ව. 10.30 ට**

අදාළ දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යන්ත්‍රෝපකරණ:- දියබෙදුම, කටුකැලියාව, සිංහ ලංකා හාල් මෝල පරිශ්‍රයේ තබා තිබෙන

වෙළඳ බඩු තොග:- දිබෙදුම, දියබෙදුම සහ කටුකෙලියාව ෆාම් හවුස් අංක 97 දරන ස්ථානයේ, දියබෙදුම, කටුකැලියාව, සිංහ ලංකා බඩු ගබඩා පරිශ්‍රයේ තබා තිබෙන සහල් සහ වී වෙළඳ බඩු තොගය.

*ගෙවීම් කළ යුතු ආකාරය .-* විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතුය.

01. ගැණුම් මිලෙන් සියයට සියයක් 100%
02. පළාත් පාලන අය බදු සියයට එකයි (1%)
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%)
04. ප්‍රචාරක වියදම් සහ අනිකුත් වියදම් 100%
05. ලිපිකරු හා සෝෂක වේතනය රු. 1500/-
06. නොතාරිස් ගාස්තුව සහ අනෙකුත් වියදම් රු. 3500/-

මෙම වෙන්දේසිය සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් COVID 19 සම්බන්ධව නිකුත් කර ඇති දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව පවත්වනු ලැබේ.

අනිකුත් තොරතුරු සඳහා පහත සඳහන් නිළධාරින්ගෙන් විමසන්න.

නීති දෙපාර්තමේන්තුව,
නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පී. එල්. සී,
අංක 242, යූනියන් පෙදෙස,
කොළඹ 02.
දුරකතන 0114218742

එල්. බී. සේනානායක,
බලයලත් වෙන්දේසිකරු, තක්සේරුකරු සහ
උසාවි කොමසාරිස්.

කොළඹ වාණිජ මහාධිකරණ සහ දිසා අධිකරණය
බලයලත් වෙන්දේසිකරු රාජ්‍ය සහ වාණිජ බැංකු
අංක 200, හල්ස්ඩෝෆ් වීදිය, කොළඹ 12,
දුරකතන 0773242954 - 0112 445393

06-73

HNB 66 - 2022

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී.- දෙනියාය ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ඩී. අබේවික්‍රම විසින් ලියා සහතික කරන ලද අංක 2815 හා 2013.10.09 දින දරන උකස් බැඳුම්කරය සහ අංක 3237 හා 2014.12.04 දින දරන උකස් බැඳුම්කරය සහ අංක 4449 හා 2018.10.18 දින දරන උකස් බැඳුම්කරය යටතේ අය විය යුතු මුදල් ගෙවීම ජාසින් ලියන ගමගේ ඉන්දික ප්‍රදීප් සහ ජාසින් ලියනගේ මියුරින් ණයකරුවන් ලෙස පැහැර හැර ඇති හෙයින්, එකී බැඳුම්කරයන් යටතේ අය විය යුතු ණය මුදල්, සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියළුම මුදල් අයකර ගැනීම පිණිස හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව පහත සඳහන් දේපළ **වර්ෂ 2022ක් වූ ජුනි මස 24 වැනි දින ප. ව. 12.30ට** එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළ.-*

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මොරවක් කෝරළේ, පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ ප්‍රාදේශීය සභා සීමාව තුළ කොඩිකාරගොඩ නැගෙනහිර ග්‍රාම නිලධාරි වසම තුළ වැලිව ගමේ පිහිටි නාවලහේන නැමැති ඉඩමට සර්වේ ජනරාල්වරයා විසින් සාදන ලද එෆ්. වී. පී. අංක 10 හි 18 කියු වශයෙන් දක්වා ඇති බෙදා වෙන් කරන ලද අක්කර 01, පර්චස් දෙක (අක්. 1, පර්. 02) ක විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි සැම සියලු දේ ද වේ.

බලයලත් මිනින්දෝරු බී. කේ. පී. ඔකඳපොළ විසින් සාදන ලද අංක 395/2008 හා 2008.10.22 දින දරන මානක පිඹුරේ මෑතකදී කරන ලද මැනීමකට අනුව මෙම ඉඩම පහත සඳහන් පරිදි මායිම් වී තිබේ.

උතුරට : එෆ්. වී. පී 10 සහ ටීපී. 335082 දරන පිඹුරේ ලොට් 18 ආර් ද, නැගෙනහිරට : ටී. පී. 335082 එෆ්. වී. පී. 10 හි ලොට් 69 බී 1/2 සහ පාර සහ ටී. පී. 331913 ද, දකුණට : එෆ්. වී. පී. 331913 එෆ්. වී. පී. 10 හි ලොට් 18 පී සහ 18 ආර් ද, සහ බස්නාහිරට : එෆ්. වී. පී. 10 හි ලොට් 18 ආර් ද මායිම් වූ රූඩ් තුනයි පර්චස් තිස් නමයක් (රූඩ් 3, පර්. 39) ක විශාලත්වයෙන් යුත් ඉඩම වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2022.05.13 දින දරන රජයේ ගැසට් පත්‍රය හා 2022.05.20 දිනැති මව්බිම, ඩේලි මිරර් සහ තිනක්කුරල් පුවත්පත් බලන්න.

HNB 66 - 2022

*දේපළට පිවිසීම.* - මොරවක සිට නෙළුව පාරේ යාර 200ක් පමණ ගමන් කොට වමට හැරී පටු කොන්ක්‍රීට් මාර්ගය දිගේ යාර 100ක් පමණ ගමන් කළ විට මාර්ගයේ දකුණු පස අදළ දේපළ පිහිටා ඇත. දේපලට පිවිසීමට පඩි පෙලක් ගොඩනගා ඇති අතර, එම පඩි පෙල තෙක් නීත්‍යානුකූලව වාහන ගමන් කිරීමට හැකියාව ඇත. අදළ දේපලට මාර්ග රක්ෂිතය හරහා ද වාහනයකින් ගමන් කළ හැකි වුව ද එය නීත්‍යානුකූල ප්‍රවේශ මාර්ගයක් නොවේ.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ දී උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (1%)ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%) ක් ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහස (රු. 2,000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් එක් දහස් පන්සියයක් (රු. 1,500) ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ගෙවිය යුතු ය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට හා දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු හා අදල ලේඛන පරීක්ෂා කිරීමට සහ වැඩි විස්තර සඳහා ජ්‍යෙෂ්ඨ කළමණාකරු, (ණය අධීක්ෂණ සහ අය කිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකතන අංක : 011 - 2661826, 2661835.

ජේ. ඩබ්ලිව්. ඊ. ජයවර්ධන,
(මුළු දිවයිනටම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
බලයලත් වෙන්දේසිකරු.

අංක 59, කුමාර මාවත,
පටුවත, දෙඩන්දූව.
දුරකථන අංක 071 - 3358434 0779- 663420
Email : ejayawardhana77@gmail.com

06-86

HNB 65 - 2022

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී.- දෙනියාය ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ඩී. අබේවික්‍රම විසින් ලියා සහතික කරන ලද අංක 3238 හා 2014.12.04 දින දරන උකස් බැඳුම්කරය සහ අංක 3575 හා 2015.11.26 දින දරන උකස් බැඳුම්කරය යටතේ අය විය යුතු මුදල් ගෙවීම ජාසින් ලියන ගමගේ ඉන්දික ප්‍රදීප් ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින්, එකී බැඳුම්කරයන් යටතේ අය විය යුතු ණය මුදල්, සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියළුම මුදල් අයකර ගැනීම පිණිස හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව පහත සඳහන් දේපළ **වර්ෂ 2022ක් වූ ජූනි මස 24 වැනි දින පෙ. ව. 11.45** ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළ.-*

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මොරවක් කෝරළේ, කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ ප්‍රාදේශීය සභා සීමාව තුළ මොරවක ග්‍රාම නිලධාරී වසම තුළ මොරවක ගමේ පිහිටි උඩහිටිහේන උඩහිටිකන්ද හෙවත් තානායම් ගොඩැල්ල උඩහිටිලන්දදෙනිය නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු අයි. කොටඹගේ විසින් සාදන ලද අංක 1304 හා 1996.04.03 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් 05 වශයෙන් දක්වා ඇති බෙද වෙන් කරන ලද පර්චස් දොළහයි දශම හයයි පහ (අක්. 0, රූ. 0, පර්. 12.65) ක විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි සෑම සියලු දේ ද වේ.

තවද, බලයලත් මිනින්දෝරු අයි. කොටඹගේ විසින් සාදන ලද අංක 1304 හා 1996.04.03 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් 102 ඔස්සේ දිවෙන මාර්ග අයිතිය සහ ඒ හා බඳුණු අනිකුත් සියලුම අයිතීන්ද සමග වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2022.05.13 දින දරන රජයේ *ගැසට් පත්‍රය* හා 2022.05.20 දිනැති මව්බිම, ඩේලි මිරර් සහ තිනක්කුරල් පුවත්පත් බලන්න.

*දේපළට පිවිසීම.* - මොරවක දෙනියාය පාරේ කි. මී. 3ක් පමණ ගිය පසු අදල දේපළ ප්‍රධාන පාරට මුහුණ ලා දකුණු අත පැත්තේ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ දී උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එක (1%)ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%) ක් ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහස (රු. 2,000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් එක් දහස් පන්සියයක් (රු. 1,500) ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ගෙවිය යුතු ය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට හා දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු හා අදල ලේඛන පරීක්ෂා කිරීමට සහ වැඩි විස්තර සඳහා ජ්‍යෙෂ්ඨ කළමණාකරු, (ණය අධීක්ෂණ සහ අය කිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකතන අංක : 011 - 2661826, 2661835.

ජේ. ඩබ්ලිව්. ඊ. ජයවර්ධන,
(මුළු දිවයිනටම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු,
බලයලත් වෙන්දේසිකරු.

අංක 59, කුමාර මාවත,
පටුවත, දෙඩන්දූව.
දුරකතන අංක 071 3358434, 0779- 663420
Email : ejayawardhana77@gmail.com

06-87

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 | 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* රු. ශ. | *තැපැල් ගාස්තුව* රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 00 | 9,340 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 00 | 950 00 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 00 | 750 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 00 | 2,500 00 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 00 | 450 00 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 00 | 275 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 00 | 4,360 00 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 00 | 3,640 00 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 00 | 1,250 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | **පිටපතක මිල** රු. ශ. | **තැපැල් ගාස්තුව** රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2022 වර්ෂය** | | | |
| **ජුනි** | 2022.06.03 | සිකුරාදා | 2022.05.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.06.10 | සිකුරාදා | 2022.05.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.06.17 | සිකුරාදා | 2022.06.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.06.24 | සිකුරාදා | 2022.06.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| **ජූලි** | 2022.07.01 | සිකුරාදා | 2022.06.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.07.08 | සිකුරාදා | 2022.06.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.07.15 | සිකුරාදා | 2022.07.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.07.22 | සිකුරාදා | 2022.07.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.07.29 | සිකුරාදා | 2022.07.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| **අගෝස්තු** | 2022.08.05 | සිකුරාදා | 2022.07.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.08.12 | සිකුරාදා | 2022.07.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.08.19 | සිකුරාදා | 2022.08.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2022.08.26 | සිකුරාදා | 2022.08.12 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ - 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.